# ස්වර්ණ ජයන්ති සංවත්සර සමරු කලාපය
# Golden Jubilee Anniversary Souvenir
# 1975 - 2025



## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
## இலங்கை மத்திய வங்கி ஓய்வூதியர் சங்கம்
## Central Bank Pensioners' Association

*With Best Compliments from...*

# PACKSENSE (PVT) LTD

**For Total Corrugated Packaging Solutions**
**(A BOI Approved Company)**







**Factory & Office:**
**491/D, Sri Sumangala Mawatha, Yakkaduwa, Ja-Ela.**
**Tel: 011-2247958, Mobile: 0701314578**
**Email: sales@packsense.lk**
**Web: www.packsense.lk**

## CENTRAL BANK PENSIONERS' ASSOCIATION
## PAST PRESIDENTS

| Name | Year |
|---|---|
| Mr. L.W.A. Weerasekara (1st President) | 1975 |
| Mr. A.C.P. Gunasekara | |
| Mr. M.S. Jalaldeen | |
| Mr. A.D.D.E. Abeyweera | |
| Mr. M.B.D. Silva | |
| Mr. W. Ranasingha | 2003 |
| Mr. Leslie Ranasingha | 2006 |
| Mr. Austin Mihindukulasuriya | 2009 |
| Dr. M.U.A. Thennakoon | 2012 |
| Mr. Laxman De Silva | 2013 |
| Mr. Jayalal Jayawardena | 2016 |
| Mr. Ariyadasa Thanthrige | 2019 |
| Mr. Jayalal Jayawardena | 2020 |
| Mr. Ariyadasa Thanthrige | 2023 |
| Mr. Jayalal Jayawardena | 2024 - 2025 |

### Some Salient Features of the Association

| | |
|---|---|
| Established in | 1975 |
| First President | L.W.A. Weerasekara |
| First Secretary | Titus Weerasekara |
| First Treasurer | N. Kumaraswamy |
| No of the members at the end of 2024 | 1100 |

### ප්‍රාර්ථනාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය සියළුම ජ්‍යේෂ්ඨ පුරවැසියන්ට චිර ජීවනය සහ සෞභාග්‍ය ප්‍රාර්ථනා කරමු.

இலங்கை மத்திய வங்கியில் சேவையாற்றிய ஓய்வூதியர்கள் அனைவரும் ஆரோக்கியத்துடனும் சகல சௌபாக்கியங்களும் பெற்று நிறைந்து விளங்க வேண்டுமென ஆசிர்வதிக்கின்றோம்.

Committee wishes long life and prosperous for all Central Bank Pensioners.



**“In appreciation of the invaluable services rendered by the Central Bank Pensioners' Association for the upliftment of well-being of the retired employees"**

**With compliments from Prof. Sirimevan S. Colombage**

# OFFICE BEARERS

## Central Bank Pensioners' Association
## 2024-2025



Hon. President
Jayalal Jayawardena
0777412289



Hon. Vice President
Ariyadasa Thanthirige
0718664238



Hon. Secretary
D.P. Chandrasiri
0714433198



Hon. Asst. Secretary
C. Hettihewa
0772900900



Hon. Asst. Secretary
L. Mohanasundaram
0778378506



Hon. Treasurer
C. Edirimanne
0777854939



Hon. Asst. Treasurer
K.M. Jayasena
0773883159



Hon. Asst. Treasurer
G. Goonasekera
0779830686



Hon. Comm. Member
Gnana Ranathunga
0774035536



Hon. Comm. Member
K.S. Thilakarathna
0713748549



Hon. Comm. Member
R.D. Athukorala
0782487823



Hon. Comm. Member/Asst. Edit.
Jagath Kariyawasam
0764443570



Hon. Social Secretary
Padmini Wijeratne
0714433222



Hon. Editor
Hemasiri Ferdinando
0718579886



Hon. Auditor
K. Jeganathan
0714287569




## “යසස” විශ්‍රාමික ණය කොමර්ෂල් බැංකුවෙන්,

ඔබත් වයස අවුරුදු 74ට අඩු, රජයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ, ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාමිකයෙක් නම් හෝ සැමියාගේ / බිරිඳගේ විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ලබා ගන්නා අයෙකු නම්, ඔබටත් කොමර්ෂල් බැංකුවෙන් යසස විශ්‍රාමික ණයක් ලබාගත හැකිය.

අවම මාසික විශ්‍රාම වැටුප රු. 25,000/- ක් විය යුතුය. එසේ නොමැති අවස්ථාවකදී, ඔබගේ බිරිඳ හෝ සැමියා ඉහත සඳහන් පරිදි විශ්‍රාම වැටුපකට හිමිකම් කියයිනම්, දෙදෙනාගේම විශ්‍රාම වැටුපෙහි එකතුව රු. 25,000/- ක් විය යුතුය.

ඉහත සඳහන් සුදුසුකම් සපුරන ඔබට,

- රු. මිලියන 5ක් දක්වා විශ්‍රාමික ණයක්
- වයස අවු. 75 වන තෙක් ණය ආපසු ගෙවීමේ හැකියාව

අවම පොලී අනුපාතයක්

COMMERCIAL BANK

*කොන්දේසි සහිතයි | +94 112 353 353 | www.combank.lk
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන ආයතනයකි | Fitch Rating A (lka)

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ (CBPA)
# ස්වර්ණ ජයන්තිය (1975 - 2025) නිමිත්තෙන්
# ගරු සභාපති ජයලාල් ජයවර්ධන මහතාගේ පණිවුඩය

**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය (CBPA) පිළිබඳ කෙටි හැඳින්වීමක්.**

අප සංගමයේ ස්වර්ණ ජයන්තිය සැමරීමේ උත්සවය මෙම වසරේ 2025 මාර්තු මස 15 දින පවත්වනු ලබන බව සතුටින් දන්වමි. 1975 වසරේදී සුභසාධක සමිතියක් ලෙස ඇරඹී මෙම සංගමය කෙටි කාලයක් තුල දී, ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය Central Bank Pensioners' Association ලෙස වර්ධනය විය. ප්‍රථමයෙන් මෙම සංගමය ආරම්භ කරන ලද විශ්‍රාමිකයින්ට අපගේ ප්‍රණාමය හා ගෞරවය පුද කර සිටිමි. අප සංගමයේ ආරම්භක සභාපති වූ අභාවප්‍රාප්ත L.W.A. වීරසේකර මහතාත්, ප්‍රථම ලේකම් වූ අභාවප්‍රාප්ත ටයිටස් වීරසේකර මහතාත්, පළමු භාණ්ඩාගාරික වූ අභාවප්‍රාප්ත N. කුමාරස්වාමි මහතාත් ඉතාමත් ආදර ගෞරවයෙන් මෙම අවස්ථාවේ දී සිහිපත් කරමි. ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank Of Ceylon) ලෙස 1950 දී අරඹන ලද බැංකුව පසුව ''ශ්‍රී ලංකා මහ බැංකුව'' (Central Bank Of Sri Lanka) ලෙස නම් කෙරුණි. අප සංගමය, ''ශ්‍රී ලංකා මහ බැංකුව'' පිහිටුවා වසර 25 කට පසුව ආරම්භ කර ඇත. අප සංගමය 2025 පෙබරවාරි වන විට මහ බැංකුවේ සියළුම ශ්‍රේණිවලට අදාල සමස්ථ සේවක පිරිස එනම් අධිපති, නියෝජ්‍ය අධිපතිවරු සිට සුළු සේවක දක්වා නියෝජනය කරන විශ්‍රාමිකයින් 1200 කින් පමණ සමන්විත වන මහ බැංකුවේ පැරණිම විශ්‍රාමික සංගමය බව සතුටින් ප්‍රකාශ කර සිටිමි. අප සංගමය වසර 50 ක් සම්පූර්ණ කිරීමේ ''ස්වර්ණ ජයන්තිය'' සමරන 2025 වසරේදීම ශ්‍රී ලංකා මහ බැංකුව 2025 අගෝස්තු මස වසර 75 ක් සම්පූර්ණ කිරීමේ ''දියමන්ති ජයන්තිය'' සමරන අවස්ථාවට පත්ව තිබීමද සුවිශේෂී අවස්ථාවකි.

අප සාමාජිකයන්ගේ වයස පිළිබඳව දළ සටහනක් පහත දැක්වේ.

| වයස | විශ්‍රාමිකයින් ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| අවුරුදු 90 ට වැඩි | 40 | 3.3% |
| අවුරුදු 80-90 | 400 | 33.3% |
| අවුරුදු 70-79 | 300 | 25% |
| අවුරුදු 60-69 | 460 | 38.4% |
| එකතුව | 1200 | 100% |

ඉහත සඳහන් සටහනට අනුව 61.6% හෝ 2/3 ආසන්න සාමාජිකයින් වයස වසර 70 ට වැඩි අය වේ.

තවද අප විශ්‍රාමිකයන් සිය ජීවන කාලයෙන් 3/4 ක් පමණ ගෙවා අවසන් කළ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික පිරිස, මහ බැංකු මුහුණ පෑ විවිධ අවදානම් දුෂ්කර අවස්ථාවලදී, එනම් 1968 ඇති ගින්න, 1971 කලබලකාරී තත්ත්වය, 1983 කලු ජූලිය, 1988/89 භීෂණය, 1996 ත්‍රස්ත බෝම්බ ප්‍රහාරය වැනි අවස්ථාවලදී තම සේවය නොමසුරුව දායක කල පිරිස වේ. මෙයට වසර 29 කට පෙර සිදු වූ මහ බැංකු බෝම්බ ප්‍රහාරය බව සැමට මතක ඇතැයි සිතමි. අප සහෘදයන් 41 දෙනෙකුට මරු කැඳවමින් හා විශාල පිරිසකට මාරාන්තික තුවාල සිදු කරමින් මහ බැංකුව ගිනිබත් වූ අවස්ථාවේදී නැවත මහ බැංකුව ගොඩ නැංවීම සඳහා කිසිදු පහසුකමක් නොමැති වුවද ධෛර්යවන්ත තම කාලය හා ශ්‍රමය නොපසුබටව ලබා දුන් පිරිස අද සිටිනුයේ අප විශ්‍රාමිකයන් අතරය. ඔවුන් එදා තම රටට පමණක් නොව මුලු ලොවටම ශ්‍රී ලංකා මහ බැංකුවට එවන් විපතක් වූ බව නොදැනෙන පරිද්දෙන් පසුදා සිටම ක්‍රියාත්මක වූ ආකාරය ප්‍රශංසණීය යි. ඒ ජ්‍යෙෂ්ඨ සහෘද විශ්‍රාමිකයින්ට අපගේ ගෞරවය මේ අවස්ථාවේ දී ද, පුද කරමි. එසේම දිගු කාලයක් සැඳෑව තැපැල් කිරීමට හා කමිටු රැස්වීම් පැවැත්වීමට පහසුකම් සැලසූ දිවංගත අයිරා වෑගොඩපොල මැතිණියට ද කොවිඩ් සමයේ කමිටු රැස්වීම් සඳහා පහසුකම් සැපයූ ආරියදාස තන්ත්‍රීගේ මහතාට ද අපගේ ගෞරවය හිමිවිය යුතුමය.

අප සංගමයේ කාරක සභාව සෑම වසරකදීම මෙම ජ්‍යෙෂ්ඨ පිරිසෙන් 5-6 දෙනෙකුගේ නිවෙස් කරා කිහිප වාරයක් යමින් ද සුවදුක් බැලීම සිරිතක් ලෙස සිදු කරන අතර, එම අවස්ථාවේදී ඔවුන් අප සමග ඉතාමත් සුහදශීලි ලෙස සතුටින් අතීතය ස්මර්ණය කරමින් ප්‍රීතියෙන් ගෙවූ බව අප ද හෘදයාංගම සතුටින් ඔබ වෙත දන්වමු.

### මරණාධාර මුදල් ගෙවීම

අප සංගමය මරණාධාර ලෙස මියගිය සෑම සාමාජිකයෙකු වෙනුවෙන් රු. 25,000/- බැගින් ඔවුන් විසන් නම් කරන ලද තැනැත්තා/ තැනැත්තිය වෙත ගෙවනු ලබයි. 2022 වසරේ දී ඒ වෙනුවෙන් රු. 800,000/- ක් ද, 2023 වසරේ දී රු. 550,000/- ක් ද ගෙවා ඇත. මෙයට අමතරව දායකත්ව මරණාධාර අරමුදලේ සාමාජිකත්වය දරණ සාමාජිකයින්ගේ මරණයක් වෙනුවෙන් රු. 75,000/- ක් බැගින් ගෙවනු ලබයි.

### සුහද චාරිකා

අප සංගමය විසින් සෑම වසරකම එක් දින චාරිකාවක් හා තෙදින චාරිකාවක් සංවිධානය කෙරේ. ඒ සඳහා සාමාජිකයින් 100 ක් පමණ සහභාගී වේ. යාපනය, සූරියකන්ද, ආරුගම්බේ, අම්පාර, නුවරඑළිය, මඩකලපුව, පාසිකුඩා, ත්‍රිකුණාමලය, පොළොන්නරුව වෙත පසුගිය වසරවලදී චාරිකා යොමු කෙරිණි. ආගමික සිද්ධස්ථාන වන්දනා කරගැනීමටත් රිසිසේ පැරණි මිතුරන් හා එක්ව අතීත මතකයන් සිහිපත් කරමින්, ගී ගයමින්, රංගනයේ යෙදීමටත් අවශ්‍ය සියලුම පහසුකම් අප විසින් සපයනු ලබයි. අප සාමාජිකයන්ගේ සුවපහසුව ගැන දැඩි අවධානයෙන් කටයුතු කරන නිසා අප හැකි සෑම විටම නවාතැන් පහසුකම් ගැන දැඩි අවධානයෙන් කටයුතු කරන නිසා අප හැකි සෑම විටම නවාතැන් පහසුකම් සපයනු ලබන්නේ තරු පංතියේ හෝටල්වල ය.

### අප සංගමයේ මූල්‍ය ස්ථාපිත තත්ත්වය

අවසන් වූ දශකය කාලය තුල අප සංගමයේ මූල්‍ය තත්ත්වය වර්ධනය විය. 2014 සිට මා සමඟ සංගමයේ කටයුතු කළ විධායක කමිටු නිළධාරින්ගෙන් ලැබූ සහයෝගය නිසා මෙය ඉටුකළ හැකිවිය. සමහර දෙනෙකු අභාවප්‍රාප්ත වී ඇත. අපගේ මුළු වත්කම් ප්‍රමාණය 2022 දී මිලියන 11.5 සිට 2023 දී මිලියන රු. 14.8 දක්වා 28.7% ප්‍රමාණයෙන් වර්ධනය විය. ආයෝජන 2022 දී රු. මිලියන 9.8 සිට මිලියන රු. 14.8 දක්වා 28.7% ප්‍රමාණයෙන් වර්ධනය විය. ආයෝජනය 2022 දී රු. මිලියන 9.8 සිට මිලියන රු. 14.8 දක්වා 28.7% ප්‍රමාණයෙන් වර්ධනය විය. ආයෝජන 2022 දී රු. මිලියන 9.8 සිට 2023 දී මිලියන රු. 12.6 දක්වා 28.7% ප්‍රමාණයෙන් වැඩි විය. එසේම ආදායම 2023 සැලකිය යුතු ලෙස වැඩි විය.

### සාමාජිකත්වය දැනුවත් කිරීම

මහ බැංකුවේ විශ්‍රාමිකයන්ට අදාල වන චක්‍රලේඛ පිළිබඳ තොරතුරු හා විශ්‍රාමික මරණයන් පිළිබඳ ''වට්ස්ඇප්'' (WhatsApp) මඟින් සාමාජිකත්වය දැනුවත් කිරීම සිදු කරනු ලබයි. විදේශගතව සිටින අප සාමාජිකයින් වෙත ''සෑදෑව'' සඟරාව Web Site මඟින් යොමු කරවන්නෙමු. වෙබ් අඩවිය www.sendewa.org මෙම කාර්යය සඳහා තම කාලය ශ්‍රමය ධනය වැය කරන ජගත් කාරියවසම් සොහොයුරානන්ට අපගේ ගෞරවණීය ප්‍රණාමය විශේෂයෙන් මෙහිදී ප්‍රකාශ කරමි. මේ දක්වා ''වට්ස්ඇප්'' අංක අප වෙත ලබා දී නොමැති අය එම අංකයන් ජගත් කාරියවසම් මහතාට ලබා දී එම පහසුකම ලබා ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

### මහ බැංකු පාලනාධිකාරය සමඟ පැවති සබඳතා

මහ බැංකු විශ්‍රාමිකයින් හා මහ බැංකුව අතර සම්බන්ධය අඛණ්ඩව පවත්වා ගනී. විශ්‍රාම වැටුප්, වෛද්‍ය ප්‍රතිලාභ හා සෙසු සුභසාධක පහසුකම් නිසා අවට නිරතුරුව මහ බැංකු පාලනාධිකාරය සමඟ සබඳතා පැවැත්වීමට සිදු වේ. එම නිසා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය ආරම්භ කළ අවස්ථාවේ සිට මේ දක්වාම මහ බැංකු පාලනාධිකාරය සමඟ කරුණු පැහැදිලි කරමින්, යෝජනා කරමින් ඉදිරිපත් කරමින්, ඉතාමත් සුහද සාකච්ඡා පවත්වමින් අප සාමාජිකයින්ගේ ගැටලු නිරාකරණය කර ගැනීමට සමත්ව ඇත. එම අවස්ථාවලදී මහ බැංකු පාලනාධිකාරය ද ඉතා උනන්දුවෙන් අප කරන කරුණු පැහැදිලි කිරීම් හා යෝජනාවන්ට සවන් දී යහපත් ප්‍රතිචාර ලබා දී ඇත. ඒ අනුව වෛද්‍ය ප්‍රතිලාභ වැඩිකර ගැනීම, විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම්, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම, නිවාඩු නිකේතන පරිහරණය කිරීමට අවස්ථාව ලබාදීම ආදිය ගෞරවයෙන් සිහිපත් කරමු. 2014 වසරේ සිට අප සංගමය ක්‍රියාත්මක කරන තෙදින චාරිකාව උදෙසා අවශ්‍ය බස් රථ සඳහා පිරිවැය මහ බැංකුව විසින් දැරීමට එවක අධිපති ධූරය දැරූ අජිත් නිවාඩ් කබ්රාල් මහතා එකඟවීම ගෞරව පූර්වකව සිහිපත් කරමු. එම අනුග්‍රහය අඛණ්ඩව මේ දක්වාත් පාලනාධිකාරය එම අනුග්‍රහය ලබා දීම කෙරෙහි ස්තූතිය පිරිනමමු. එම අනුග්‍රහය අපගේ චාරිකාව වියදම අවම කර ගැනීම පිණිස අප සාමාජිකයින්ට මහත් අස්වැසිල්ලක් වී ඇත.

පසුගිය වසර කිහිපය තුළ රටේ ඇති වූ ආර්ථික පරිහානිය දැඩි ලෙස අප විශ්‍රාමිකයන්ට ද බලපා ඇත. ඒ අනුව බඩු මිල ඉහළ යාම, බෙහෙත් මිල හා රෝහල් ගාස්තු ඉහළ යාම හා අනිකුත් සේවා වියදම් ඉහළ යාමට ගැලපෙන සේ අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා කරුණු පැහැදිලි කිරීම් පාලනාධිකාරයේ සැළකිල්ලට භාජනය වූ අතර, 2023 වෛද්‍ය ප්‍රතිලාභ සංශෝධනය සුභදායි ලෙස අප වෙත ලබා දී ඇත.

**ලංකාවේ ආර්ථික තත්ත්වය**

2021 හා 2022 යන වර්ෂ වල ශ්‍රී ලංකාව පත් වූ අයහපත් ආර්ථික තත්ත්වය යටතේ උවද, අප සංගමයේ කටයුතු ඉතාමත් හොඳින් කළමණාකරණය කර ගැනීමට අප සංගමයට හැකිවිය. පහත සඳහන් සටහන අනුව 2019-2023 අතර විදේශීය සංචිත හා විනිමය අනුපාතය දක්වා ඇත.

| අයිතමය | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| **දළ විදේශීය සංචිත එ.ජා. ඩොලර් මිලියන** | 7642 | 5664 | 3139 | 1898 | 4392 |
| **විදේශ වත්කම්** | 10402 | 8521 | 6122 | 5874 | 9373 |
| **විනිමය අනුපාත** (LKR – US$) | 181.63 | 180.41 | 200.43 | 363.11 | 323.92 |
| **වාර්ෂික සාමාන්‍යය** (මූලාශ්‍ර CBSL 2024) | 178.78 | 185.52 | 198.88 | 324.55 | 327.53 |

2023 වර්ෂය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව දළ විදේශීය සංචිත ප්‍රමාණය ඇ.එ.ජා. ඩොලර් මිලියන 4382 දක්වා ඉහළ නංවා ඇත. මේ සඳහා දේශීය වෙළඳපොළෙන් විනිමය මිලදී ගන්නා ලදී. එසේ නමුත් ගෙවුම් ශේෂයට ඇති වී තිබෙන බලපෑම එසේම පවතී.

**පාසල් උපකරණ ප්‍රධානය කිරීම**

මෙම ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් අප කාරක සභාවේ යෝජනාවක් පරිදි රාජගිරිය රෝමානු කතෝලික දමිල විද්‍යාලයේ ආර්ථික අපහසුතා ඇති සිසු සිසුවියන් 50 දෙනෙකුට 2025 වසරට අදාල සියලුම පාසල් උපකරණ පරිත්‍යාග කරන ලදී. අපගේ ඉල්ලීම පරිදි ඊට මූල්‍යමය දායකත්වයෙන් සහයෝගය දැක් වූ අප සහෘදයන්ට මෙහිලා අපගේ විශේෂ ස්තූතිය පිරිනමමු. එසේම මෙම ස්වර්ණ ජයන්තිය සමරණ ස්වර්ණමය අවස්ථාවට අපගේ ආරාධනයෙන් සපැමිනි සියලුම ආරාධිතයන් හා අප සාමාජිකයන් වෙත සංගමයේ හෘදයාංගම ස්තූතිය පුද කරන අතර ඉතා වාසනාවන්ත නීරෝගිමත් අනාගතය ඔබ සැමට ප්‍රාර්ථනා කරමු.

සුබ දීඝායු...

**ජයලාල් ජයවර්ධන**
සභාපති
ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය

**இலங்கை மத்திய வங்கியின் ஓய்வூதியம் பெறுவோர் சங்கத்தின் பொன்விழா தொடர்பாக தலைவர் மாண்புமிகு திரு. ஜயலால் ஜயவர்த்தனவிடமிருந்தான செய்தி (1975-2025)**

மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கம் 2025இல் அதன் பொன் விழாவினைக் கொண்டாடுகின்றது. எமது சங்கம் 1975ஆம் ஆண்டில் ஓய்வூதியம் பெறுவோர் குழுவொன்றுடன் நலன்புரி அமைப்பொன்றாக நிறுவப்பட்டது. இது பின்னர் சங்கமாக வளர்ச்சியடைந்தது. ஆகவே இச்சங்கத்தினை ஆரம்பித்தவர்களுக்கு நாம் நன்றியுடையவர்களாக இருத்தல் வேண்டும். எமது முதலாவது தலைவராக காலஞ்சென்ற திரு. எல். டபிள்யூ. ஏ. வீரசேகராவும் முதலாவது செயலாளராக காலஞ்சென்ற திரு. ரிட்டஸ் வீரசேகரவும் முதலாவது பொருளாளராக காலஞ்சென்ற திரு. என். குமாரசுவாமியும் பணியாற்றினர். மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கம் இலங்கை மத்திய வங்கி நிறுவப்பட்டு (1950) சரியாக 25 ஆண்டுகளின் பின்னர் உருவாக்கப்பட்டது. இப்பொழுது நாங்கள் பொன்விழாவினை கொண்டாடுகின்ற இவ்வேளையில் இலங்கை மத்திய வங்கி இவ்வாண்டு ஓகத்தில் 75 ஆவது ஆண்டு நிறைவினைக் கொண்டாடுகின்றது.

பின்வரும் அட்டவணை 2023.12.31இல் உள்ளவாறு எமது உறுப்பினர்களின் வயதுப் பகுப்பாய்வினை மேலெழுந்தவாரியாகத் தருகிறது.

| வயது | எண்ணிக்கை | சதவீதம் |
|---|---|---|
| 90 மற்றும் அதற்கு மேல் | 40 | 3.3 சதவீதம் |
| 80 – 89 | 400 | 33.3 சதவீதம் |
| 70 – 79 | 300 | 25.0 சதவீதம் |
| 60 – 69 | 400 | 38.4 சதவீதம் |
| மொத்தம் | 1200 | 100.0 சதவீதம் |

மேலேயுள்ள அட்டவணை ஏறத்தாழ 61.6 சதவீதம் அல்லது ஏறத்தாழ 2/3 அங்கத்தவர்கள் 70 வயதிற்கு மேற்பட்டவர்களாக இருப்பதனைக் காட்டுகிறது. எனினும், 30 இலிருந்து 40 அங்கத்தவர்கள் வருடாந்தம் இறந்துவிடுகின்றனர். மேலும், 53 விதவைகள் மற்றும் அனாதைகள் இலங்கை மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கத்தின் உறுப்பினர்களாக மாறுகின்றனர். சங்கம், காலஞ்சென்றவர்களின் நியமனத்தர்களுக்கு 2022இல் ரூ.800,000 இனையும் 2023இல் ரூ.550,000 இனையும் அன்பளிப்புச் செய்கின்றது. கடந்த ஆண்டுகளிலும்கூட இறந்துபோன எமது உறுப்பினர்களின் நியமனத்தர்களுக்கு நன்கொடைகளை வழங்கியிருக்கிறது.

மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கம் உறுப்பினர்களின் மரணம் தொடர்பான செய்திகளையும் ஏனைய இன்றியமையாத செய்திகளையும் வட்ஸ்அப் மற்றும் முகநூல் வாயிலாக, நிருவாக உறுப்பினருடன் பதிவுசெய்து கொண்டுள்ள எமது உறுப்பினர்களுக்கு அறியத்தருகிறது. எமது நிருவாக அலுவலர் திரு. ஜகத் காரியவசம் அவர்கள் ஆற்றும் பணிகளுக்காக எமது இதய பூர்வமான நன்றிகளை தெரிவித்துக்கொள்ள விரும்புகிறோம். மேலும், நாங்கள் ஒரு வெப்தளத்தினையும் பேணுகின்றோம். இதில் நீங்கள் மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கத்தின் தகவல்களையும் முன்னைய அனைத்து சந்தேவ சஞ்சிகைகளையும் பார்வையிடலாம். வெப்தளம் www.sendewa.org

சகாக்கள் 2025 சனவரி 29 அன்று இராஜகிரிய, ஹோமன் கத்தோலிக்க தமிழ் வித்தியாலயத்தில் தரம் 5 இலிருந்து தரம் 10 வரை கல்விகற்கும் தேவையுடைய 50 மாணவர்களுக்கு பாடப்புத்தகங்கள், கொப்பிகள் போன்றவற்றை அன்பளிப்புச் செய்தமையின் மூலம் பொன்விழா கொண்டாட்டங்களை நாம் ஏற்கனவே ஆரம்பித்துவிட்டோம். குழு அங்கத்தவர்கள் நலன்விரும்பிகள் மற்றும் வேறு சிலர் வழங்கிய நன்கொடைகளுடன் இந்நிகழ்வினை சிறப்பாக மேற்கொள்ள முடிந்தது,

**சுற்றுலா**

மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கம், அங்க உறுப்பினர்களின் குறைந்தபட்சம் இரண்டு கூட்டங்களை வருடாந்த ஒன்றுகூடல் (ஒரு நாள்) மற்றும் மூன்று நாள் சுற்றுலா ஆகிய

வடிவங்களில் ஆண்டுதோறும் நடத்துகின்றது. கொவிட்-19 இன் காரணமாக 2021 இலும் 2022 இலும் எந்தவொரு ஒன்றுகூடலையோ சுற்றுலாவினையோ ஒழுங்குசெய்யமுடியவில்லை. நிறைவேற்றுக் குழு உறுப்பினர்கள் அனுபவிக்கக்கூடிய இடங்களுக்கு சுற்றுலாவினை ஏற்பாடு செய்ததுடன் விசேடமாக நாங்கள் உறுப்பினர்களின் நன்மைகருதி, இரண்டாம் நாள் இரவு விருந்துபசாரத்தில் சங்கீத கச்சேரியையும் ஒழுங்குசெய்திருந்தோம். இசைக்குழுவினால் வழங்கப்பட்ட சங்கீத சுருதிக்கேற்ப உறுப்பினர்கள் பாடியும் ஆடியும் மகிழ்ந்து போயினர். யாழ்ப்பாணம், சூரியகந்த, அறுகம்குடா, நுவரெலியா, பாசிக்குடா, மட்டக்களப்பு, திருகோணமலை, தம்புள்ளை மற்றும் பொலநறுவை என்பன விஜயம் செய்த இடங்களில் சிலவாகும். சாத்தியமான விதத்தில் 3 அல்லது 4 நட்சத்திர விடுதிகளில் தங்குமிட வசதிகள் வழங்கப்பட்டன. இவ்வொன்றுகூடலில் உறுப்பினர்களின் பங்கேற்பு மிகச்சிறப்பாகக் காணப்பட்டது. இவ்விரண்டு நிகழ்வுகளிலும் ஏறத்தாழ 90 இலிருந்து 100 வரையான ஆட்கள் கலந்துகொண்டனர்.

**மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கத்தின் நிதியியல் நிலைமை**

சங்கத்தின் நிதியியல் நிலைமை கடந்த தசாப்த காலத்தில் மேம்பட்டது. ஆளுகை மிக்க நிறைவேற்றுக்குழுவின் ஆதரவுடன் 2014 இலிருந்து கடந்த பத்தாண்டுகளாக என்னால் சங்கத்தினை வழிநடத்தக்கூடியதாக இருந்தது. என்பதுடன் பணியாற்றிய அத்தகையவர்களில் சிலர் காலமாகிவிட்டனர். தற்பொழுது நிதியியல் நிலைமை பின்வரும் விதத்தில் சிறந்த நிலையில் காணப்படுகின்றது. மொத்தச் சொத்துக்கள் 2022ஆம் ஆண்டின் ரூ.11.5 மில்லியனிலிருந்து 2023இல் ரூ.14.8 மில்லியனுக்கு அதிகரித்திருக்கிறது. முதலீடுகள் 2022இன் ரூ.9.8 மில்லியனிலிருந்து 2023ஆம் ஆண்டில் 12.6 மில்லியனுக்கு உயர்வடைந்து. இது, 28.7 சதவீதமான அதிகரிப்பினை பிரசன்னப்படுத்துகிறது. செலவினை விஞ்சிய வருமானம் 2022ஆம் ஆண்டின் ரூ.0.7 மில்லியனிலிருந்து 2023இல் ரூ.2.5 மில்லியனைப் பிரதிபலித்தது. இது, 25.7 சதவீதம் கொண்ட அதிகரிப்பினை பிரசன்னப்படுத்துகிறது. இப்புள்ளிவிபரங்கள் நாம் சங்கத்தின் நிதியினை எவ்வளவு கவனத்துடன் முகாமைப்படுத்தியிருக்கிறோம் என்பதனை எடுத்துவிளக்குகின்றது.

**இலங்கை மத்திய வங்கியுடனான உறவுகள்**

ஆரம்பத்திலிருந்தே நாங்கள் மத்திய வங்கியின் முகாமைத்துவத்துடன் மிக அந்நியோன்யமான உறவுகளையே கொண்டிருக்கிறோம். கலந்துரையாடல்களூடாக எமது உறுப்பினர்கள் தொடர்பான பிரச்சனைகளுக்கு தீர்வு காணக்கூடியவர்களாக இருந்தோம். ஆளுநர்களும் முகாமைத்துவமும் ஓய்வூதியம் பெறுவோரின் நலனோம்புகைகள் பற்றி மிகுந்த அக்கறை கொண்டிருந்தனர். இலங்கை மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோரின் பிரச்சனை பற்றி மிகச் சாதகமாக நடந்து கொண்டதுடன் வங்கியில் ஓய்வூதியம் பெறுவோர் கடைப்பிடித்த தரங்களை பேணுவது தொடர்பாகவும் அவர்கள் மிகுந்த அக்கறை கொண்டிருந்தனர். மக்கள் என்ற ரீதியில் அவர்கள் கஸ்டமான காலப்பகுதியில் மத்திய வங்கியினால் பாதுகாப்பதற்கு பொறுப்பாக இருந்திருக்கின்றனர். 1968இல் பரவிய தீ 1971, 1988, 1989ஆம் ஆண்டுகளில் காணப்பட்ட கிளர்ச்சி 1983இன் கறுப்பு யூலை மற்றும் எமது ஊழியர்களில் 41 பேர் உள்ளிட்ட 100 இற்கும் மேற்பட்ட மக்கள் கொல்லப்பட்ட 1996 சனவரி 31இல் இடம்பெற்ற குண்டு வெடிப்பு என்பனவற்றை இன்னும் நாம் நினைவுபடுத்தக்கூடியதாக இருக்கிறது. மத்திய வங்கியாளர்கள் என்ற ரீதியில் நவீன தொழில்நுட்பவியல் ஏதுமில்லாததொரு காலப்பகுதியில் நாம் கடுமையாக பணியாற்றியதன் மூலம் மத்திய வங்கியை நிலைநிறுத்தக்கூடியவர்களாக இருந்தோம். குண்டு வெடித்ததை உடனடுத்து, வேலை செய்வதற்கு சரியான இடமில்லாத ஒரு நிலையில், படிகளில் கோப்புக்களை வைத்துக்கொண்டு இராஜகிரிய விதுபியசவில் தொழிற்படத்தொடங்கினோம். அலுமாரிகளோ மேசைகளோ அல்லது கதிரைகளோ இருக்கவில்லை. இருப்பினும்கூட, மத்திய வங்கி அதன் கடமைகளைச் சரியான முறையில் ஆற்றக்கூடிய ஒரு நிலைக்கு மத்திய வங்கியை உயர்த்தும் எமது இலக்கினை நாம் மிகுந்த சிரமத்துடன் மேற்கொண்டோம். வங்கியுடனான அந்நியோன்யமான பேச்சுவார்த்தைகளினூடாக நாங்கள் விசேட கொடுப்பனவுகள், மருத்துவ நன்மைகள் திட்டம், புகைவண்டி ஆணைச்சீட்டு, விடுமுறைக்கான பங்களா போன்ற ஒரு சில நன்மைகளைப் பெறக்கூடியவர்களாக இருந்தோம். நாங்கள் அப்போது வங்கியின் ஆளுநர்களாக இருந்தவர்களுக்கும் முகாமைத்துவத்தினருக்கும் மிகுந்த நன்றியுடையவர்களாவோம். 2014ஆம் ஆண்டிலிருந்தும் மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கத்தினால் ஒவ்வோராண்டும் ஏற்பாடு

செய்யபட்டுவரும் மூன்று நாள் சுற்றுலா போக்குவரத்திற்கான செலவினை வங்கியே செலுத்திவந்திருக்கிறது. மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கம் இவ்வசதியை பெறுவதற்கு ஒப்புதலளித்த அப்போதைய ஆளுநர் திரு. அஜித் நிவாட் கப்ராலுக்கு எமது மிகுந்த நன்றிகளைத் தெரிவித்துக்கொள்கிறது. இப்பொழுதும் மூன்று நாள் சுற்றுலா போக்குவரத்திற்கான செலவினை வங்கியே தாங்கிக்கொள்கிறது. ஓய்வூதியம் பெறுவோருக்கு இவ்வுதவியைத் தொடர்ந்தும் வழங்குவதற்கு வங்கியின் தற்போதைய ஆளுநருக்கும் முகாமைத்துவத்திற்கும் எமது நன்றிகள் சென்றடையட்டும். நாங்கள் ஆளுநர் முனைவர் வீரசிங்க 2021.01.01 இலிருந்து நடைமுறைக்குவரும் விதத்தில் 2023இல் வழங்கிய ஓய்வூதிய அதிகரிப்பிற்கும் 2023இல் வழங்கிய மருத்துவ நன்மைகளுக்காகவும் மிகுந்த நன்றியுடையவர்களாவோம்.

**நாட்டின் பொருளாதார நிலைமை**

2021 மற்றும் 2022ஆம் ஆண்டுகளில் நாடு மிகுந்த மோசமான பொருளாதார நிலைமைகளை எதிர்கொண்ட போதும் நாம் சங்கத்தின் நடவடிக்கைகளை வெற்றிகரமாக முன்கொண்டு சென்று நடத்தக்கூடியவர்களாக இருந்தோம்.

**பின்வரும் அட்டவணை வெளிநாட்டு ஒதுக்கு மற்றும் வெளிநாட்டுச் செலாவணி வீத அசைவுகளைக் காட்டுகிறது**

| விடயம் | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| மொத்த அலுவல்சார் ஒதுக்குகள் (ஐ.அ.டொலர். மில்லியன்) | 7642 | 5664 | 3139 | 1898 | 4392 |
| மொத்த வெளிநாட்டுச் சொத்துக்கள் (ஐ.அ.டொலர். மில்லியன்) | 10402 | 8521 | 6122 | 5874 | 9373 |
| செலாவணி வீதம் (இல.ரூ/ ஐ.அ.டொலர்) ஆண்டு முடிவில் | 181.63 | 186.41 | 200.43 | 363.11 | 323.92 |
| ஆண்டுச் சராசரி | 178.78 | 185.52 | 198.88 | 324.55 | 327.53 |

மூலம்: இலங்கை மத்திய வங்கி

இலங்கை மத்திய வங்கி உள்நாட்டுச் சந்தையிலிருந்து வெளிநாட்டுச் செலாவணியினை ஈர்த்துக்கொண்டமையின் மூலம் 2023ஆம் ஆண்டு இறுதியில் மொத்த அலுவல்சார் ஒதுக்குகளை 4392 மில்லியன் டொலர்களுக்கு மேம்படுத்தியது. எனினும், சென்மதி நிலுவை மீதான அழுத்தம் தொடர்ந்தும் காணப்பட்டது. நாட்டின் வங்குரோத்து நிலைமை பிரகடனப்படுத்தப்பட்டமையின் பின்னர் வெளிநாட்டுப் படுகடனைச் செலுத்தத்தவறியமையின் காரணமாக பன்னாட்டு ஒதுக்கின் இருப்பு உயர்டைந்தது.

மத்திய வங்கியின் ஓய்வூதியம் பெறுவோர் என்ற ரீதியில் நாட்டின் நிலை காரணமாக நாங்களும் கூட இடர்பாடுகளை எதிர்நோக்கவேண்டியிருந்தது. மத்திய வங்கியில் வேலைசெய்த காலப்பகுதியிலும் கூட இடப்பாடான காலப்பகுதியில் மத்திய வங்கியை உயர்த்துவதற்கு கடுமையாக பணியாற்றியிருக்கிறோம். ஆகவே, ஓய்வூதியம் பெறுவோர் ஆகிய நாங்கள் வங்கியை பொறுத்தவரை எமது கடமைகளை நாம் சரியாக ஆற்றியிருக்கிறோம் என்பது பற்றியும் இடர்பாடான காலப்பகுதியில் சங்கத்தினை நன்கு சரியாக முகாமைப்படுத்தியிருக்கிறோம் என்பது பற்றியும் திருப்திப்படமுடியும்.

நான் விருந்தினர்களுக்கும் அழைப்பை ஏற்று வந்திருப்போருக்கும் எனது வாழ்த்துக்களை தெரிவிப்பதுடன் எதிர்காலத்தில் நீங்கள் நல்லனவற்றையெல்லாம் பெறவும் நல்ல ஆரோக்கியத்துடன் வாழவும் வாழ்த்துகிறேன்.

ஜயலால ஜயவர்த்தன
தலைவர்
மத்திய வங்கி ஓய்வூதியம் பெறுவோர் சங்கம்
2025 மாச்சு 15

# The message from the Hon. President Mr. Jayalal Jayawardena on Golden Jubilee of the Central Bank Pensioners' Association. (CBPA) [1975-2025]

**Brief history of the CBPA**

The central Bank Pensioners' Association (CBPA) is celebrating the Golden Jubilee,(50 years) this year, 2025. Our association established in the year 1975 with a group of pensioners, as a welfare organization and developed to an Association. Therefore, we are very much grateful to those who started the Association. Our First president was late Mr. L.W.A.Weerasekara, First Secretary was late Mr. Titus Weerasekara and First Treasurer was late Mr. N. Kumaraswamy. The CBPA originated exactly after 25 years of establishment of The Central Bank of Ceylon (1950). Later became the Central Bank of Sri Lanka. (CBSL).Now we are celebrating the Golden Jubilee while CBSL will commemorate its $75^{th}$ year in August this year (2025).

**The following table indicate approximate age analysis of our members as at 31.12.2023.**

| Age | Number | Percentage |
|---|---|---|
| 90 and above | 40 | 3.3% |
| 80-89 | 400 | 33.3% |
| 70-79 | 300 | 25.0% |
| 60-69 | 460 | 38.4% |
| Total | 1200 | 100.0% |

The above table shows that about 61.6 % or nearly 2/3 of members are over 70 years old. However, 30 to 40 members pass away annually. In addition, 53 W&OP have become members of CBPA. The association had donated to nominees of those whom passed away, Rs.800, 000/= in the year 2022 and Rs.550, 000/= in the year 2023. In the past years, too we have donated to nominees of members upon a death of a member.

CBPA has an arrangement to inform a death of a member and vital messages through WhatsApp & Facebook to our members, who have registered with administer. Our heartfelt thanks should go to administer Mr. Jagath Kariyawasam for the services rendered. In addition, we have a web site where you can find information of the CBPA and all previous Sendewa magazines. Web site: www.sendewa.org

We have already commenced golden jubilee calibration by donating copybooks and other materials to fifty needy students from grade 5 to grade 10 at the Roman Catholic Tamil Vidyalaya, Rajagiriya, on 29 Jan 2025. With participation of committee members and well wishes and some of whom were made contribution to this event.

**Tours**

CBPA arrange at least two meetings of members of the association, in the form of annual get-together (one day) and three-day tour, every year. We were unable to arrange any get –together or tours in 2021 and 2022 due to Covid 19. The EXCO arranged tours to places where members could enjoy, especially; we provided music at the party on the night of second day for the benefit of the members. They sing and dance to the tune of music played by the band. Some of the places visited are Jaffna, Sooriyakanda, Arugumbay, Ampara, Nuwara-Eliya, Pasikuda, Batticolow, Trincomalee, Dambulla, Polonnaruwa etc. The accommodation provided in 3 or 4 star hotels where possible. The participation of members on these gatherings were very good. It was around 90 to 100 persons participated in both occasions.

**Financial position of the CBPA**

The financial position of the Association improved during the last decade. I was able to lead the association during last ten years, since 2014 with the support of able executive committee members. Some of them, whom worked with me, have passed away. Now financially we are in a sound position, as follows. The total assets increased to Rs. 14.8 ml in the year 2023 from Rs. 11.5 ml in the year 2022. Representing an increase of 28.7%. Investments rose to Rs. 12.6 ml in the year 2023 from Rs.9.8 ml in the year 2022. Representing an increase of 28.5%. The income over Expenses reflected Rs. 2.5 ml in the year 2023 from Rs. 0.7ml in the year 2022. Representing an increase of 257%,.These statistics show how carefully we have managed the finances of the association.

**The relationship with CBSL.**

From the beginning, we had very cordial relationship with the management of the CBSL. We were able to solve issues regarding our members, through discussions. Governors and the management were interested about wellbeing of the pensioners. The CBSL was very much favorable with regard to problems of pensioners and they were keen on preserving the standards maintained by the pensioners at the Bank, as they were the people who were responsible for safeguarding CBSL during difficult times. We can still remember of fire in 1968, insurrections in the years 1971, 1988, 1989, Black July in 1983 and the bomb blast in 1996 that claimed 41 members of our employees and in all over 100 people killed. Still we can remember that day, 31st Jan.1996! As Central Bankers, we were able to uplift the CBSL by working hard without any of the modern technology. Immediately after the bomb blast, we started operations at VIdu Piyasa Rajagiriya, without proper place to work, just keeping files on the stare case. No cabinets no proper tables or chairs. Even though we stuck to the task of uplifting CBSL to a position where CBSL could perform its duties promptly. Through cordial negotiation, with the Bank, we were able to receive the special payment, Medical benefit scheme, Railway warrants. Holiday bungalows etc. are the few benefits. We are extremely thankful to then Governors and the management of the Bank. Since the year 2014, the bank has been born the cost of transport for three-day trip every year, arranged by CBPA. We are very much thankful to then Governor Mr. Ajith Nivard Cabral for approving this facility to CBPA. The Bank is still bear the cost of transport of three-day tour. Our thanks should go to the present Governor and the management of the bank for continuing this support to Pensioners. We shall be thankful to the Governor Dr. Nandalal Weerasingha for granting us an increase in pension in 2022, with effective from 01.01.2021 and an increase in medical benefit in 2023.

**Economic situation of the country**

When country was facing a very bad economic situation in the years 2021 and 2022, we were able to manage affairs of the association successfully.

**The following table will show the Foreign Reserves and Exchange Rate Movement.**

| Item | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| Gross Official Reserves (USD millions) | 7642 | 5664 | 3139 | 1898 | 4392 |
| Total Foreign Assets (USD ml) | 10402 | 8521 | 6122 | 5874 | 9373 |
| Exchange Rate(LKR/USD) Year -end | 181.63 | 186.41 | 200.43 | 363.11 | 323.92 |
| Annual Average | 178.78 | 185.52 | 198.88 | 324.55 | 327.53 |

Source: CBSL. 2024.

The CBSL improved the gross Official Reserves up to 4392 million USD by the end of the year 2023 by absorbing foreign exchange from the domestic market. However, pressure on balance of payment continues to remain. While the rise in the international reserves stock is due to default of foreign bebt, after declaring bankruptcy of the country.

AS the pensioners of the Central Bank, we too have to face the difficulties, because of the situation of the country. While working at CBSL also we worked hard during difficult periods to uplift the Bank. Therefore, as pensioners, we can be satisfied that we have performed our duties well towards the Bank and have managed the association well during difficult periods.

I wish guests, invitees and members, all the very best and good health in the future. DIRGAYOO!!!

**Jayalal Jayawardena.**
**President**
**Central Bank Pensioners' Association.**
**15 Mar 2025.**

# අම්හිරි අතීතයෙන් පසු.....

මහ ගෙදරින් කලින් එළියට     එනකොටම
කෙනෙහිලිකම් කෙරුණි නොසිතුව     තරමටම
එන දුක් කම්කටොලු පෙරලෙයි     කණපිටම
සතුටින් එක්ව උන්නොත් අප     හැමවිටම

හෙණ ගෙඩි ගින්නේ මහ බැංකුව තිබුණ     වැටී
ගොඩගනු පිණිස අපෙ අයමයි මුලින්     සිටී
රිංගා මරු කටින් ඇති දේ බැඳන්     මිටී
සිහිවෙයි එදා කදමලු කර ගහපු     හැටී

කළ සේවයට ලද උරුමය වී     සොත්ති
දිවි ගැට ගසයි කොටු වී හතරක     බිත්ති
හිතුනොත් හොඳයි මනුසත් දහමෙන්     යුක්ති
දැන් කෙළි, අපේ ලේ ගංගා උඩ     විත්ති

හැළි අත තිබුණ අය තරකරගෙන     මඩිය
බිල්ලට ගත්තෙ සොච්චම් පෙන්ෂන්     පඩිය
කැප වී ගොඩගත්තු අපෙ තැන පා     එඩිය
අද බැහැ ඒ බිමට තබනටවත්     අඩිය

මහ මැදුරකින් අත තිබු දේ බිමට     දැමූ
පසු වෙන දෙයින් සැනසෙන්නට හිතට     ගමූ
පවනක් කරන් වා රැලි අප දෙසට     හැමූ
අපි එක සිතින් එන විදියකට එකට     ඉමූ

**VRS විශ්‍රාමික - ජේමදාස අතාවුද**
(වි.අ. 3146)

# බලා ඉමි .....

පාට බොදවුණා සිතුවමක් ලෙස
රටා මවනා නිල් අහස් කුස
නෙත් අයාගෙන බලාගෙන ඉමි
ඔබේ රුව මතුවේ යැයි සිතාගෙන
අහම්බෙන් ඉදිකඩුල්ලෙන් පැන
පුරුදු විලසින් සිනාසීගෙන
මගේ නෙතු මානයේ ඔබේ රුව
මැවේ යැයි ඉදිමි බලාගෙන එදා වාගේ
හෙන්දිරික්කා මල් පිපුණේ නෑ සැදෑ කාලේ
ඔබේ වියෝගය දැනී ගිරවුන්
ආවේ නෑ ගෙමිදුලේ අඹයක රස
බලන්නට
ඇවිත් දූ පුතුන් ඉදහිට
සොයා බැලුවත් මගේ වගතුග
සිතට සුවයක් නොමැත දැණුනේ
ඔබේ මතකය නිසා හදවත රිදුම් දුන්නේ
දස දෙසින් මවනා විට අඳුරු සෙවනැලි
පාළුවයි තනිකමයි අතරේ
තවත් සිහිකර මතක අපගෙ
කඳුළු බිඳුවක් නෙතු අගින් ගිලිහේ
තවත් යන්නට බොහො දුර
සිතට වාරුව ගන්න බැරුවා

මතු සසරේ යළිත් ඔබ මා
මුණගැසේවා පතමි නිරතුරු බුදුන් වැඳ

**ආරියවතී මුතුකුමාරණ**
(W & OP 842)

## ගරු ලේකම්තුමාගේ පණිවුඩය

1975 වසරේදී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ ස්වර්ණ ජයන්තිය 2025 මාර්තු මස 15 වන දින අභිමානවත් ලෙස සමරන්නීය. එය මෙම සංගමයේ ධජය සෙවනේ ඒකරාශී වී සිටින සහෘදයින් හැමදෙනාටම සුවිශේෂී ජයග්‍රහණයකි. මන්ද, පුරා වසර ගණනාවක් තුළ විවිධ හැල හැප්පීම්, බාධක, කම්කටොලු, ගැහැට විඳ දරා ගනිමින් ජයග්‍රාහීව පෙරටම පැමිණ සිය ජීවන ගමන් මගේ පනස් වන සැතපුම් කනුව පසු කිරීම අප කාටත් සාඩම්බරයට පත්විය හැකි අවස්ථාවකි.

මෙහි විශේෂත්වය නම් ජීවිතයේ සැදෑ සමය ගත කරන සහෘදයන් එකම ධජයක සෙවන යටතේ කැපවීමෙන් එක්සත්ව කටයුතු කිරීමයි. නායකත්වය, මගපෙන්වීම, නිවැරදි දිශානතියකට සංගමය මෙහෙයවීම හිටපු සභාපතිවරුන් ඇතුලු දායකත්වය දැක්වූ සහෘදයින් හැමදෙනාවම මේ මොහොතේ කෘතවේදීත්වයෙන් සිහිපත් කරමි. 1975 දී ප්‍රථම සභාපතිවරයා වශයෙන් එල්.ඩබ්.ඒ. වීරසේකර මහතා හා ලේකම් වශයෙන් ටයිටස් වීරසේකර මහතාගේත් මූලිකත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය නමැති මුල බීජය රෝපණය කරමින් ඉතා කැපවීමෙන් හා එකමුතු කමින් සුරැකිව හදා වඩා ගත් අප සංගමය අද වන විට මහා දැවැන්ත වෘක්ෂයක් බවට පත්ව ඇත්තේ ය. මහ බැංකු මාතාවගේ සෙවන ලැබූ අධිපතිතුමාගේ සිට පහලම සේවකයා දක්වා බහුතරයකගේ විශ්‍රාම ජීවිතයට සෙවන දෙන දැවැන්තම විශ්‍රාමික සංගමය ලෙස පුරා වසර පනහක් ඔබ හැම වෙනුවෙන් කැපවී ක්‍රියා කල සංගමයක් වීම ඉමහත් සතුටට කරුණකි.

එදා එල්.ඩබ්ලිව්.ඒ. වීරසේකර මහතාගේ නායකත්වයෙන් ආරම්භ කල අප සංගමය සී.පී. ගුණසේකර, එම්.එස්. ජලල්ඩීන්, ඒ.ඩී.ඩී.ඊ. අබේවීර, එම්.බී.ඩී. සිල්වා, ඩබ්ලිව්. රණසිංහ, ඔස්ටින් මිහිඳුකුලසූරිය, ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන්, ලක්ෂ්මන් ද සිල්වා, එස්.කේ.ජේ.යූ. ජයවර්ධන හා ආරියදාස තන්ත්‍රිගේ මහත්වරු දක්වා යුගයෙන් යුගයට පුරා දශක ගණනාවක් තුල මේ හැම සභාපති වරයෙකුගේම උදාරතම කැපවීමෙන් පෙරටම රැගෙන ආ අප සංගමය අද ජයලාල් ජයවර්ධන මහතාගේ නායකත්වයෙන් යුතුව ස්වර්ණ ජයන්තිය සමරනු ලබයි. අද වන විට අපේ සාමාජිකත්වය, වැන්දඹු අනත්දරු සාමාජිකයින් ද, ඇතුළුව 1100 ක පමණ පිරිසක් මේ ධජය සෙවනේ ඒකරාශිවී සිටීම අපට මහත් ශක්තියකි. ඒ ඒ යුගයන් හී ශ්‍රී ලංකා මහ බැංකුවේ සිටි හැම අධිපතිවරයෙක්ම ඇතුලු පාලක මණ්ඩලය හැම විටම අප සංගමයට පූර්ණ සහයෝගය මේ දක්වාම ලබාදීම පිළිබඳව සංගමයේ ප්‍රණාමය හා ගෞරවය කෘතවේදීව පිරිනමනු කැමැත්තෙමි.

අද ස්වර්ණ ජයන්තිය සමරණ ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ සියලුම සාමාජික සහෘදයින් සිය කැපවීම හා සහයෝගය හැමවිටම සංගමයට ලබාදීම පිළිබඳව ලේකම් වශයෙන් මගේ හෘදයාංගම ස්තුතිය පළකරමි. එසේම ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය තව තවත් ශක්තිමත්ව ඉදිරි අනාගතය කරා පියවර තබන්නට මං පෙත් විවර වේවායිද, අප සංගමයට තවත් දශක ගණනාවක් තුල ඔබට සේවය කරන්නට ශක්තිය ධෛර්යය හා වාසනාව ලැබේවායි ද සාමාජික ඔබ සැමට චිර ජීවනය ද ප්‍රාර්ථනා කරමි.

අපගේ කටයුතු සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදුන් මහ බැංකු අධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයද ලේකම් තුමා ඇතුළු කාර්ය මණ්ඩලයද අධ්‍යක්‍ෂක තුමා ඇතුළු පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයද අධ්‍යක්‍ෂක තුමිය ඇතුළු රාජගිරිය විදු පියස කාර්ය මණ්ඩලයද ටයිප් සෙටින් කළ මොරටුව හිරු ක්‍රියේෂන්ස් කාර්ය මණ්ඩලයද මුද්‍රණ කටයුතු මනාව කරදුන් ගංගොඩවිල නියෝ ග්‍රැෆික්ස් කාර්ය මණ්ඩලයටද විධායක කමිටුවේ කෘතවේදීත්වය පිරිනමනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය දිගුකල් දිනේවා!

**ඩී.පී. චන්ද්‍රසිරි**

ගරු ලේකම්

## The Message from the Hon. Chief Guest Former Governor Dr. Indrajith Coomaraswamy

"It is a great pleasure to send a message acknowledging the very constructive role played by the Central Bank of Sri Lanka Pensioners' Association, on the occasion of its Golden Anniversary. The Association has worked steadfastly to improve the economic status and social well being of its membership.

A special word of thanks should be conveyed regarding the role played by its President, Mr Jayalal Jayawardena, through his dedicated and tireless service."

**Dr. Indrajit Coomaraswamy**

# Central Bank Act enhances CBSL's independence for effective monetary policy

**By Prof. Sirimevan S. Colombage**
**Emeritus Professor of Economics, Open University of Sri Lanka**
**and Former Director of Statistics, Central Bank of Sri Lanka**

The previous Government enacted the Central Bank Act (CBA) of 2023 to enhance Central Bank Independence (CBI), replacing the Monetary Law Act (MLA) that had been in force since the inception of the Central Bank of Sri Lanka (CBSL) in 1950. This was a major component of the economic recovery package adopted by the Government to overcome the economic crisis under the Extended Fund Facility (EFF) of the International Monetary Fund (IMF) for a four-year period starting from March 2023. The severe economic crisis faced by Sri Lanka since 2022 reflected multiple economic setbacks including unsustainable fiscal and balance of payments deficits, foreign debt default, foreign exchange shortages, inflationary pressures, and negative GDP growth.

Containment of the fiscal deficit that exceeded 10 percent of GDP during the period 2020-2022 was a major priority of the policy reforms. Deficit financing became extremely strenuous by 2020 due to the mounting foreign debt service commitments and constraints in domestic borrowings. The unfinanced portion of the fiscal deficit, therefore, had to be accommodated by the CBSL. For this purpose, the CBSL used its monopoly power to create 'fiat money' to lend to the government. Revenue generation by the government through such money creation, known as 'seigniorage', caused an increase in the CBSL's monetary base. It brought about multiple expansions of the aggregate money supply, causing severe macroeconomic imbalances including high inflation, exchange rate appreciation, balance of payments deficits, and foreign exchange depletion. Such monetary expansion resulting from the budget deficits has been a perennial problem in Sri Lanka for many decades, and it was a major cause of the recent economic crisis. As part of the economic recovery policy package, the previous Government enacted the Public Financial Management Act of 2024 to improve fiscal policy for better macroeconomic management, in tandem with the CBA.

It is widely recognized that a sufficiently high level of CBI is desirable for achieving price stability, which is the sole objective of modern central banks. In the literature, the term 'independence' is used interchangeably with the term 'autonomy'. Independence refers to the lack of institutional constraints while autonomy implies operational freedom. In practice, there are different types of CBI, such as goal independence and instrument independence. The broadest concept is goal independence, which authorizes the central bank to decide on its primary objective. However, it is generally accepted that the monetary policy goals should be decided by the government, as the elected political authorities are accountable to the electorate for any policy changes.

As per CBA, price stability is the primary objective of the CBSL, enforcing a Flexible Inflation Targeting (FIT) monetary policy framework along with a flexible exchange rate regime. Financial stability is the secondary objective of the CBSL, according to the CBA. The MLA, however, had no such hierarchy of objectives.

The CBA is expected to insulate the CBSL from political pressures in conducting monetary policy. Although the CBSL enjoyed a fair degree of independence under the MLA, the compelling demand from the fiscal authorities for central bank credit to finance the budget deficit restricted the CBSL's monetary policy space. It resulted in fiscal dominance over monetary policy. Specifically, the CBSL had to continuously purchase unsold Treasury Bills in the weekly auctions to meet day-to day fiscal demands causing an accumulation of CBSL's holdings of government securities. Thus, there was extensive monetary financing through primary Treasury Bill auctions when the government faced

huge budgetary shortfalls during 2020-2022. As a result, the CBSL failed to conduct its Open Market Operations by selling Treasury Bills to absorb any excess market liquidity. Accumulation of Treasury Bills also led to a rise in the CBSL's monetary base (also known as reserve money) causing a rise in the money supply, which is commonly known as 'money printing'.

The CBA prevents such monetary financing of the fiscal deficit, eliminating fiscal dominance over monetary policy to ensure price stability. Accordingly, the CBSL is prohibited from (a) purchasing securities issued by the government or any other public entity in the primary market, and (b) directly or indirectly offering credit to the government or any public entities. In contrast, under the MLA, the CBSL was allowed to provide advances and guarantees to the government and participate in primary Treasury Bill auctions.

It is significant to note that the prohibition of monetary financing under CBA has led to a reduction in CBSL's net lending to the Government. Thus, greater independence given to the CBSL under the CBA helps insulate the monetary authority from political pressures, eradicating fiscal dominance over monetary policy.

In terms of the CBA, the CBSL has two main Boards in operation, namely the Governing Board (GB) and the Monetary Policy Board (MPB). The GB has the responsibility of overseeing the administration and management of the affairs of the CBSL and the determination of its general policy, other than monetary policy. The GB consists of the CBSL's Governor as the Chairperson and six members who possess expertise in Economics, Banking, Finance, Accounting and Auditing, Law, or Risk Management. The MPB is in charge of the formulation of the monetary policy of the CBSL and the implementation of a flexible exchange rate regime in line with the FIT framework to achieve and maintain domestic price stability. The MPB has the responsibility to regulate the supply, availability, and cost of money, taking into account the macroeconomic and financial conditions of Sri Lanka. The MPB consists of the CBSL Governor as the Chairperson, members of the GB, two experts in Economics or Finance, the Deputy Governor in charge of price stability, and the Deputy Governor in charge of financial system stability.

The CBA further strengthens CBSL's independence by removing government representation from both the GB and the MPB. Previously, the Secretary to the Treasury was a member of the Monetary Board of the CBSL, as per MLA.

Under the CBA, the CBSL is expected to use a FIT monetary policy framework. It is empirically proved that inflation-targeting monetary policy provides greater independence to central banks, shielding it from political pressures. It is a monetary policy strategy under which a country's central bank aims to maintain a pre-announced inflation rate over a specific time frame. Transparency and accountability are the two essential components of inflation targeting. Transparency implies that the central bank should disseminate the inflation target with justification via public announcements, ensuring that the central bank does not miss the set target. For accountability purposes, the CBA requires the CBSL to submit reports to the Minister of Finance in the event of economic disturbances threatening price stability.

Enhancing the requirements of transparency and accountability further, the CBA the CBSL to communicate Monetary Policy Board decisions of the CBSL to the public, in mandates addition to the usual annual reports and financial statements. The CBA also provides legal underpinnings for the establishment of an Audit Committee, consisting of non-executive board members, to assist the GB in its oversight of the CBSL.

It needs to be emphasized here that the provision of CBI under the CBA is a necessary, but not a sufficient condition for price stability, as fiscal authorities can undermine the CBSL's independence by accommodating fiscal shortfalls through commercial bank borrowings, causing inflationary

pressures. Since the enactment of the CBA in September 2023, an increase in commercial bank lending to the Government is evident nullifying the beneficial effects of the decline in CBSL's lending to the Government. Most of the annual the voter base to secure election victory rather than introducing objective policy measures within a coherent macroeconomic framework, ensuring sustained stability and growth. Thus, tax and expenditure measures have been largely driven by politically motivated arbitrary decisions. Such policies tended to be discretionary, lacking a rule-based system. Considering these adverse consequences, it is essential to improve fiscal discipline, as laid down in the Public Financial Management Act, to achieve and maintain the CBSL's primary objective of price stability, as envisaged in the CBA.

1. The CBSL (then, Central Bank of Ceylon) was established under the Monetary Law Act No. 58 of 1949. Prior to the establishment of the CBSL, the Currency Board System set up under the Paper Currency Ordinance No, 32 of 1884 functioned as the country's monetary authority. The Central Bank of Sri Lanka Act, No. 16 of 2023 was gazetted on 15th September 2023.
2. Fiat money, or paper money, is not backed by any commodity, such as gold. Fiat money became popular after the collapse of the Bretton Woods system in 1971, when the U.S. government ceased the conversion of the dollar into gold.
3. During 2020-2022, referring to an unfounded notion called the 'Modern Monetary Theory' (MMT), the CBSL authorities justified monetary finance by arguing that a sovereign government is free to meet its fiscal deficit by printing money in place of taxation and that it would have no impact on inflation.
4. The Public Financial Management Act, No. 44 was gazetted on 9th August 2024 repealing the Fiscal Management (Responsibility) Act of 2003.

## ජීවිතය දැකීම

පුළුන් රොදක්සේ සැහැල්ලුවෙන් සිටියෙමි
කුරුල්ලෙකුසේ නිදහසේ සැරි සැරූයෙමි
වැට කඩොලු මායිම් සීමා බන්ධන
මගේ ලෝකයේ නොවීය

ලොව සුන්දර විශ්මිත දේ සොයා ගියෙමි
කාලය මට හරස් වූයේ නැත
සාගර, දේශාන්තර, කඳු වැටි නිම්න තරණය කෙළෙමි
මල් මෙන් ලස්සන අඟනුන් ඇසුරු කෙළෙමි
ඔවුන්ගේ ආදරය, සෙනෙහස නිබඳව ලැබුවෙමි

කවි ගීත මා වෙතින් ලියවුණේ නිරායාසයෙනි
ඒවා බොහොමයක් ප්‍රේමය හා මුසුවුණු ඒවාය
ආත්මාර්ථකාමීත්වය, කුහකකම මම හෙලා දුටුවෙමි
සෙනෙහස, ආදරය, පරිත්‍යාගය මගේ ලෝකය විය

අහෝ කාලය.... මම ඔබට දොස් නොකියමි
ජීවිතයේ හැම දෙයක්ම අනිත්‍යය
මම ඒ සත්‍යය අත්විඳිමින් සිටිමි

මගේ භද්‍ර යෞවනය මා වෙතින් පලාගොස් ඇත
ජීවිතයේ වසන්තය සැමදා පවතින්නේ නැත
මම දැන් මහල්ලෙක්මි....

මරණයට මා බිය නැත
මගේ තාරුණ්‍යය මට නැවත නැවත සිහිවේ
එයින් මගේ ගතට සිතට ලොකු ශක්තියක් ඇතුල් වේ
ඒ ශක්තිය මගේ මරණය.... මෙලොවින් සමු ගැනීම
දිනෙන් දින කල් දමයි...!

**නිමල් චාර්ල්ස් වික්‍රමසිංහ**

## අවසාන වස්තුවත් වික්කෙමි

නුඹ නික්ම ගොස් කලක් ගතවුණි
ජීවිතේ කුමටදැයි සිතුවෙමි
මැරෙන්නට සිතූ නමුත් එකවිට
එයට සවියක් හිතට නොතිබුණි

නෑයිනුත් මා ඉවතලූ පසු
දිවි ගෙවන්නට මඟක් නොපෙනුණි
සුදහ ගින්නෙන් කුසත් වැළපුණි
කුලී වැඩවත් දුන් කෙනෙක් නැති

නුඹ යළිත් ඒවියැයි නොසිතුණි
පිච්චියක්වත් අතේ නැතිවුණි
ජීවිතේ ගැටගසා ගන්නට
අවසාන වස්තුවත් මා සතු
නගරයේ මහතුනට වික්කෙමි

උරණ නොමවනු හිමියනේ මට
මා පුතුට නුඹෙ ලෙය උරුම නැති

**ආරියරත්න ජයසිංහ**
**(වි.අංක 1104)**



# විශ්‍රාමය හා අර්ධ ශතකයක්

- මිනිසා ශ්‍රේෂ්ඨත්වයට පත්වන්නේ විශිෂ්ඨත්වයේ බලයෙනි.
- විනයක් යනු බලහත්කාරයෙන් හෝ නීතිරීති මගින් හෝ ආරක්ෂා කළ යුත්තක් නොව එය පුද්ගලයා තුළ අභ්‍යන්තරිකව ඇති වන්නක් විය යුතුය.
- නායකත්වය යනු බලය නොව විනයයි. ඒ සඳහා වැදගත් වන්නේ දැනුමයි.
- අනුන්ට දිය යුත්තද අනුන්ගෙන් ගත යුත්තද අවශ්‍යයෙන්ම කළයුතු කාර්යද අතපසු කරන විට කාලය එහි සාරයි බොයි (**හිතෝපදේශය**)

සමාජය කියන්නේ ඔබේත් මගේත් අනිකාගේත් සම්බන්ධතාවල ප්‍රතිඵල වලටයි. හැම සමාජයකටම කාලයාගේ නොනවතින ගමනත් එක්කම ප්‍රගතිශීලී වෙනස්වීම් ඕනමයි. 1950 දශකය වෙන කොට අපේ ලාංකීය සමාජයත් ප්‍රගතිශීලී වෙනසකට සුදුසුකම් ලබමිනුයි තිබුණේ. ඒ වෙනකොට නිදහසත් ලැබිලා ඡන්ද බලයත් ලැබිලයි හිටියෙ. එහෙම නම් කහවනු, මස්ස, දොයිතුව, පවුම්, සිලිම්, පැන්ස මගින් ප්‍රාථමික හුවමාරු ඒකකත් වඩාත් නූතන වෙන්න ඕන බව විද්වත් පාලකයන්ට දැනුණා. ඒ හින්දම තමයි 1950 අගෝස්තු 28 දා සිට ශ්‍රී ලංකාවේ මූල්‍ය අධිකාරිය පටන් ගත්තේ. ඒක තමයි 1950 අංක 49 දරණ මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව කියලා ආයතනයක් නම් කෙරුණේ. ඒ එක්කම තමයි අපේ රුපියල පන ලබන්නේ. ඉන් පස්සේ රුපියල බෞතිස්ම වෙනවා. රුපියල උපසම්පදා වෙනවා. ඒ කියන්නේ ලංකා සමාජ ක්ෂේත්‍රය භාණ්ඩ හා සේවා හුවමාරුවේ රන් කිරුළ පළඳිනවා.

මේ නූතනත්වයත් එක්කම මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම ආශ්‍රය කරගෙන වැඩ කටයුතු ගොඩක් ජනිත වෙනවා. ලේසි පහසු වැඩ නෙමෙයි. ගැඹුරුයි. සංකීර්ණයි. සංඛ්‍යාත්මකයි. පර්යේෂණාත්මකයි. අධීක්ෂණාත්මකයි. මෙම භාරදූර කටයුතු දියත් කිරීමට යහපත් වගේම කාර්යශූර ශ්‍රම හමුදාවක් ද බඳවා ගත්තා. ක්‍රමක්‍රමයෙන් මූල්‍ය පාලනය හා ආර්ථිකය පර්යේෂණාත්මකව මෙහෙයවන කොට මහ බැංකුවේ දෙපාර්තමේන්තු වැඩි වෙනවා. තව තවත් අළුතෙන් දෙපාර්තමේන්තු ඇති කරනවා. ඒ එක්කම තව තවත් බුද්ධිමත් කාර්යශූර පුද්ගලයන් ලිංග භේදයකින් තොරව මහ බැංකු සේවාවට බඳවා ගත්තා. එහෙම ආවාට ගියාට බඳවා ගත්තේ නෑ. ලිඛිත ශාස්ත්‍රීය විභාගයක් තියලයි ගත්තෙ. සේවාවට බඳවා ගත්තට පස්සේ අපි එකිනෙකා හඳුනා ගත්තා. එකට වැඩ කළා. වැඩ කිරීම අළුත් අත්දැකීමක් වුණා. ප්‍රතික්ෂේප කිරීම් නැතිව ඉෂ්ඨ කරන්නට ඉගෙන ගත්තා. ඒ නිසා සංතෘෂ්ටිය අපේම සම්පතක් වුනා. ජීවිත අවබෝධය පුළුල් වුණා.

ජීවිතය ජීවමාන අනිකුත් සියල්ලටම වඩා වේගෙන් වැඩිමහළු වෙනවා. කවුරු කැමති වුනත් අකමැති වුනත් සත්‍යය ඒකයි. එකමත් එක දවසක කොයි කාටත් කල්පිරෙනවා.

ඒ සදාතනික සත්‍යයට නමස්කාර කරමින් අපිත් වැඩිමහළු වුණා. ඒ නිසාම ආයතනය විසින් අපව විශ්‍රාමිකයන් කළා. අළුත් අයට තැන දෙමින් පරණ අප ඉවත් වුණා. ඒ සමගම සඳාදරණීය ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව ගැන ඇතිවන සාංකාව මිශ්‍ර වී එන ආදර භක්තියට අනික් සියළුම මිණුම් කිරුම් ගිණුම් අවලංගු වෙනවා.

මුල්ම විශ්‍රාමික ගමන ආරම්භ වෙන්නේ 70 දශකය තුළදියි. එදා සිට විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කවදත් එකමුතුයි. සංවාදශීලියි. සාමූහිකයි. සංවේදියි. හාපුරා කියා විශ්‍රාමය වැළඳගත් ජ්‍යෙෂ්ඨයන් අතලොස්සක් විසින් පොදු තුරු හෙවනක් රෝපණය කළා. එය මහ බැංකුවේ හැම තරාතිරමකම විශ්‍රාමිකයන් උදෙසාම සෙවණ ගෙනෙන නුග සෙවණක්ම තමයි. අප දැනට ඒකරාශී වෙලා ඉන්නේ මේ ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය. කියන නුගසෙවනේමයි.

වර්ෂ 1975 දී රෝපණය කළ ළදරු පැලය කාලයත් සමග තව තවත් දළු කොළ එකතු වෙමින් තුරු සෙවනට අරුත් සපයනවා. අපගේ මෙම සුදෝ සුදූ විශ්‍රාමික සංගමය මේ වන විට 50 වසරක් හෙවත් අඩසියවසක් සපුරමින් ඉන්නවා.

මෙම ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සංගමයට ඉතාමත් දිගු ගමනක් තිබිය හැකි බව දුටු ප්‍රථම විදග්ධ සභාපති වූයේ **අයි. ඩබ්ලිව්. ඒ. වීරසේකර** මහතාය.

එදා පටන් අද දක්වා මෙම සංගමයට ජවය සැපයූ ගරු සභාපතිවරුන් වූයේ ඒ. සී. පී. ගුණසේකර, එම්. එස්. ජල්දීන්, ඒ.ඩී.ඩී.ඒ. අබේවීර, එම්.බී.ඩී. සිල්වා, ඩබ්ලිව්. රණසිංහ, ලෙස්ලි රණසිංහ, ඔස්ටින් මිහිඳුකුලසූරිය, එම්. යූ. ඒ. තෙන්නකෝන්, ලක්ෂ්මන් සිල්වා ආරියදාස තන්තිරිගේ සහ ජයලාල් ජයවර්ධන යන මහත්වරුන්ය.

මිනිස් දිවියේ කල් පිරීමෙන් පස්සේ උදාවෙන විශ්‍රාමය සුවයෙන් සහ අනුප්‍රාණවත්ව ගත කර ගැනීම සඳහා අවශ්‍ය වෙන හුඟක් දේවල් මේ සොඳුරු තුරු සෙවන හෙවත් විශ්‍රාමික සංගමය තුළ කතිකා වෙනවා. එහෙම කතිකා වල මල්ඵල ගැනීමක් විදියට තමයි **සාමූහික ගිවිසුමට** එළඹෙන්නේ.

පවත්නා භාණ්ඩ හා සේවාවන්ගේ මිල සංචලතාවන් වලට ඔරොත්තු දීම අවධානයට අරගෙන පවතින රජයන් අවුරුදු පතා අයවැය යෝජනා මගින් රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කරනවා. ඒත් බැංකු ක්ෂේත්‍රයට වැටුප් සංශෝධනය සිදුවෙන්නේ අවුරුදු 3 කට එක් වරයි.

රජයේ හා වානිජ බැංකු එහෙම තීරණයකට ඇවිත් ඉන්නේ ඒ ඒ ආයතන වලට අදාළ සාමූහික ගිවිසුම් අනුවයි. එසේම රාජ්‍ය බැංකු හා වානිජ බැංකු ද අනෙකුත් සෑම මූල්‍ය සමාගම් ද අධීක්ෂණය කරමින් මූල්‍ය පද්ධතිය ස්ථායීව පවත්වාගෙන යන්නේ මහ බැංකුවයි.

ඒ අතරතුර මහ බැංකුවේ නිර්මල සොඳුරු අතීතය කිසියම් කිළිටි කිරීමක් රාජ්‍ය අනුග්‍රහයකින් සිද්ධ වෙනවා. අදූරදර්ශී, අඥබාල, අවිද්‍යාත්මක, අත්නෝමතික, පිරමිඩාකාරී දේශපාලන සංග්‍රහයක් මගින් මහ බැංකුව මෙතෙක් පැමිණි දීප්තිමත් සොඳුරු ගමන් මගට අඳුරු පැල්ලමක් වැටෙනවා. ඒක නුදුරු දශකයකුත් තව පොඩ්ඩක් අතීතයට ගිය කැලැන්ඩර වකවානුවට අයිතියි. ටික කලකින් මූලික ආසනය අතහැර දමා ගිය ඥාති සංග්‍රහය යළිත් එම ඥාතී වර්ගයාගෙන්ම පත් වීම නැවත ලබන්නේ කැබිනට් බලතල ද ඇතුවයි. එම දශක එකහමාර ද ඇතුළත්ව තමයි ශ්‍රී ලංකා මහ බැංකු 75 ත්, විශ්‍රාමික සංගමය 50 ත් සමරන්න සූදානම් වන්නේ,

ඒ අඳුරු පැල්ලම් සහිත වකවානුවේ වූ අදූරදර්ශී අවිද්‍යාත්මක අත පෙවීම් නිසා භාණ්ඩ හා සේවාවන්ගේ මිල මට්ටම් ගියේ අයාලේ. ණය කඳු ඉදිමෙන්න වුණා. ගෙවුම් ශේෂයත් ගිනියම් වුණා. රජයේ නව ව්‍යාපෘති සල්ලි නැතිව ලත් තැනම ලොප් වුණා. අවිධිමත් ලෙස රාජ්‍ය බලයේ තෙරපුම් හා ගෙරවුම් නිසා මූල්‍ය ප්‍රතිපත්තිය සලිතවෙන්න ගත්තා. ඒ සමගම උද්ධමනය කුළු හරකෙක් වගේ වුණා. පැන පැන අනින්න වුණා.

එම ඇනුම් වල රිදුම් කැක්කුම් තදින්ම දැනෙන අල්ප සරළ පාරිභෝගිකයන් අතර විශ්‍රාමික අපත් ඉන්නවා. සේවාවේ සිටින හා විශ්‍රාමික රජයේ කාර්ය මණ්ඩල වලට අවුරුදු පතාත් සියළුම බැංකු සේවාවල කාර්ය මණ්ඩල වලට අවුරුදු තුනකට වතාවක් බැගිනුත් වැටුප් හා විශ්‍රාම වැටුප් වැඩි කිරීමේ සංශෝධනයන් කරනවා.

ඒත් ........? ඒත් මහ බැංකු විශ්‍රාමිකයන්ට අවුරුදු 4 කින් සත 05 කින්වත් කිසිම සංශෝධනයක් කළේ නෑ. 80 දශකයේ ඉඳල මුදල් මණ්ඩලයත් සමාජ විද්‍යා හා ආර්ථික විද්‍යාත්මක දැනුමෙන් පොහොසත් අධිපතිතුමන්ලා ඇතුළු එවකට සිටි සියළුම නිලයන් මනාප වූ සාමූහික ගිවිසුමේ විශ්‍රාමිකයන 'ද සඳහා වූ සංශෝධිත ගැලපුම දැනට අහෝසි කරල වසර හතරක් ගත වෙලා. මේ වසර ගානටම උද්ධමන කුළු මීමා ඇනපු ඇනීම් තාම එහෙමමයි. එම උද්ධමනය විසින් මහ බැංකු විශ්‍රාමිකයින් ද මනුස්‍යයෝය කියලා තේරුම් අරගෙන නෑ. .

ඒ වගේම තවත් හැඩයකට කියනවා නම් අද දවසේ මහ බැංකු මව් තුරුල්ලේ දුවන පනින කටයුතු කරන කාර්යක්ෂම ඔබේ කැපවීම නිසා මෑත වසර දෙකක් හෝ තුනක් තුළ මහ බැංකුව යළිත් සුව සම්පතින් නැගී සිටිමින් ඉන්න බව දැනෙමින් තියෙනවා. පසුගිය පිරමීඩාකාර අතපෙවීම් මගින් ආර්ථිකය අයාලේ යැවීම නිසා අසමත්ව බංකොළොත් වූ රට ඒ තත්ත්වයන්ගෙන් මිදෙමින් පවතිනවා.

වත්මන් අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාගේ හා අනෙකුත් කාර්ය මණ්ඩලයේ දැනුමේ හා කැපවීමේ ප්‍රතිපල වශයෙන් බංකොලොත් බවින් මිදෙමින් පැවතීම සැනසිල්ලට කරුණක්. ඒ එක්කම මහ බැංකුවේ මුලින්ම විශ්‍රාම ගිය පිරිසෙන් බහුතරයක්වන අප ද මනුෂ්‍යයන් කොටසක්ය කියලා තේරුම් ගන්න. අත්හිටුවා ඇති සිවු වසරක දුක් ගීතය සුව ගීතයක් කරන්න, විශ්‍රාමික අප ද අසමත් හා බංකොලොත් බවින් මුදවා ගන්න. එයම 50 වසර සමරන අපට ජවයක්, සවියක් හා තිළිණයක් ද වනු ඇත.

විශ්‍රාමික සංගමයේ පනස් වැනි සංවත්සරය සුවෙන් හා සතුටින් සමරමු !!!

**---- අමරපාල කරසිංහ ආරච්චි----**

# තුන්සක රියේ ඇඳි සිත්ගත් වැකි



- හර්ස් එකේ යනකොට - පර්ස් එක ගෙනියන්නෙ නෑ.
- හැමෝම බැලුවෙ මගේ අඩුපාඩු අම්ම විතරයි බැලුවෙ මගේ මදිපාඩු
- ජීවිතේම සල්ලි කරගත්තත් - මාරයා පගාව ගන්නෙ නෑ
- අපායේ නඩු අහනකොට - ලෝයර්ස්ලා නෑ - තීන්දුව විතරයි
- ඔය ගොල්ලන්ට රඟන්න වෙලාව තිබුනට අපිට බලන්න වෙලාව නෑ
- අපි නැගිට්ටිනවට කැමැත්තෙන් හිටියෙ හිටගෙන ය නඅය විතර්යි
- අපිට නොවෙයි බඹුටත් මරු ළඟා වෙතේ පිනට දුන්න දේ පමණක් ඉතිරි වෙතේ
- පොල් අතු වැටෙන කොට ගොක් අතු හිනැහෙනවා ගොක් අතු උනත් දිනකදි පොල් අතු වෙනවා
- ඇස් ඉදිරිපිට වෙස් පෙරළෙන මිනිස්සු එක්ක මොන බැඳීම්ද?
- කට්ට කන්න බැරිනම් - හීන මවන්න එපා
- හොඳ කියන්න ඇඹරෙන මිනිස්සු - නරක කියන්න පොරකනවා
- අපි වැටුන හැටියට නැගිට්ටෙ නැත්නම් තාම පාරේ තමයි
- පොළොවෙ ටයිල් නැති උනාට bro උසාවි වල ෆයිල් නෑ
- උපත-විපත අතර ලියන රචනාවකි ජීවිතේ !
- ඉබ්බන්ට පියාඹන්න හිතුනම කොක්කුන්ට හරි වදේ
- කට්ට කන තරමටයි ජීවිතේ පට්ට
- මැරෙන අපි ඉරෙන කොළ වලට දඟලන හැටි
- ඇතිදා රැඟුවෙත් නෑ - නැති දා ඇඩුවෙත් නෑ
- කීවත් මුවින් රස වෑහෙන මිහිරි කතා මිනිසා තමයි හඳුනාගත නොහැකි සතා
- කියන තරම් කෙල්ලෝ ලස්සන නම් ඇයි මෙච්චර *Beauty Salon*

| | | | | |
|---|---|---|---|---|
| අම්මගේ | පන | ''උරා බොන කොට ඇගේ ලේ | ටික | අතුරු මිතුරු දඹදිව තුරු |
| තාත්තගේ | නම | සිනහ වී කිරි කරපු | හින්දා | කිව්වේ ගොඩක් නයි පොළොංගු |
| මට ඕන | නෑ | නිවන් දැකලා විතර නම් | මදි | |
| අනුන්ගේ | බන | බුදු වෙයන් හෙට අපේ | අම්මා'' | |

**ඥානා රණතුංග**

---

# ඔබ නියම නායකයෙක් ද?

අප බොහෝ දෙනකු නායකයන් වීමට කැමැත්තක් දක්වයි. එහෙත් සෑම කෙනකුටම හොඳ නායකයෙකු විය නොහැක. හොඳ නායකයෙකු නම් තමා සමඟ සිටින කණ්ඩායමේ අන් අයගේ සහයෝගය ලබා ගැනීමට දක්ෂතාවයක් තිබිය යුතුය. නායකයෙකුට පහත සඳහන් ගුණාංග තිබීම අවශ්‍ය වේ.

1. දක්ෂතාවය
2. තාක්ෂණිකත්වය
3. ප්‍රත්‍යක්ෂ ඥානය
4. දැනීම
5. පෞරුෂත්වය
6. ධාරණ ශක්තිය
7. චින්තන ශක්තිය
8. අධිෂ්ඨානය
9. ඉවසීම
10. ධෛර්යය

ඉහත ගුණාංග සහිත පුද්ගලයෙකු යහපත් නායකයෙකු වීමට නම් ඔහු විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතුය.

1. ප්‍රශ්නවලදී මූලිකයා වීම.
2. ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.
3. ප්‍රශ්නවලින් පැන නොයාම.
4. යෝජනාවල ගුණ දොස් විවේචනය කිරීමට හැකි වීම.
5. උචිත යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වීම.
6. ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.
7. ගන්නා ලද තීරණ වැරදි නම් ඒවා වෙනස් කිරීමට මැලි නොවීම.
8. ගතානුගතික ක්‍රම මඟහැර සිටීම.
9. හොඳ සන්නිවේදකයෙකු වීම.
10. සුහදතාව වර්ධනය කර ගැනීමට හැකි වීම.
11. ප්‍රශ්න සමතයකට පත් කිරීමට හැකි වීම.
12. අපක්ෂපාතී වීම.
13. අන් අය විසින් පිළිගනු ලැබීම.
14. තමාගෙන් තනතුරට ගෞරවයක් ලබා දීම.

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමෙන් ඔබ හොඳ නායකයෙකු ද නැති ද යන්න ඔබටම වටහා ගත හැක.

**චන්ද්‍රදාස හෙට්ටිහේවා**

# ප්‍රථම ස්ථානය දිනූ කෙටිකතාව

# රික්ෂෝකාරයා

## එස්.ඒ. කරුණාරත්න

**ශ්‍රී ලංකා මහ බැංකුවේ සංස්කෘතික සංගමය විසින් 1994 පවත්වන ලද නිර්මාණ කුසලතා තරඟයේ දී ප්‍රථම ස්ථානය දිනූ කෙටි කථාව.**

**මෙහි කතුවරයා 1996 ජනවාරි 31 දී මහ බැංකුවට එල්ල වූ ත්‍රස්ත්‍රවාදී බෝම්බ ප්‍රහාරයෙන් අකල්හි මරු වසඟයට පත්විය. එතුමාට උපහාරයක් පිණිස නැවත පළකෙරිණි.**

ආරුමුගම් රික්ෂෝ රස්සාව කරන්නට පටන් ඇරන් අවුරුදු තිහක් විතර වෙනවා. දැන් ආරුමුගම්ට වයස අවුරුදු පණහක් විතර ඇත. ඉස්සර නං රික්ෂෝ කාරයෙක් දවසට හොයාගන්නා ගාන හොඳටම පිරිමැහුන අඹුදරුවන් එක්ක කරදරයක් නැතිව ජීවත්වෙන්ඩ. ඒත් දැන්නම් දවස පිරිමහ ගැනීම ඒතරං ලේසි නැහැ. ඒ එක්කල ටැක්සිකාරයෝ වැඩිවෙන්ඩ වැඩිවෙන්ඩ මිනිස්සු රික්ෂෝවල ගමන් යෑම අඩුවුණා. ඒ අතරෙ පත්තරවලින් රික්ෂෝවල මිනිස්සු තියාගෙන ඇදන්යාම ලංකාව වගේ රටකට කොහොමත්ම හොඳ නෑ කියලා මතේකුත් ගෙනාවා. හැබැයි ඕව ගැන කෑගහන අෑයො ආරුමුගම්ලා කන්නේ කොහොම ද? අඳින්නේ කොහොම ද? කියලා හිතුවේ නෑ. කොහොම නමුත් රික්ෂෝවෙන් බඩුමුට්ටු ටිකක් ගෙදරකට ගෙනිහින් දීලා වයසක මහත්තයෙක් රේල්ලුවට ඇරලලා ලැබෙන දේ පරිස්සමින් වියදං කරාන මේ ඇත්තොත් එදාවේල ගැටගහ ගත්තා.

දවසක් උදේ නමයට විතර බොරැල්ලේ මාර්කට් එක ළඟ ආරුමුගම් රික්ෂෝවත් තියාන එහි පාපුවරුවේ වාඩිවී සුරුට්ටුවක් පත්තු කරගෙන බිබී කල්පනා කර කර හිටියා. කාර් බස්වල සද්දෙයි ට්‍රොලි බස්වල ගොරෝසු නලා හඬයි මුලු හතරවටෙන්ම ඇහෙනවා. මස් කඩේ පැත්තෙන් මස් කටුවක් ඩැහැගෙන ආ බල්ලෙක් ආරුමුගම් පසුකරගෙන ගිහින් පාර අයිනෙ තිබුණු පෙට්ටි ගොඩකත් අස්සට වුණා. බෝගහේ හෙවන අස්සේ මුල උඩ වාඩිවෙලා ඉන්න බුලත්විට වෙළෙන්දිය පුවක් ගෙඩියක් ලෙලි අරිමින් ගිරයෙන්ම පුවක් ගෙඩියේ කුරුට්ට අරිමින් ද, හොඳකළ පුවක් ගෙඩිය ගිරයට අල්ලා හතරට පළු ගහන හැටි ආරුමුගම් මහත් ඕනෑකමින් බලා හිටියා. ''රික්ෂෝ.... රික්ෂෝ'' කියලා නෝනා කෙනෙක් කථා කරනවා ඇහිලා ආරුමුගම් හිතට වැටුණු අරමුණින් මිදී ගැස්සිලා නැගිට්ටා. නෝනා දෑතටම බරටම බඩු මලු ඇරං හරිම වැදගත් පෙනුමක් තියෙන වයස විසිඅටක විතර කෙනෙක්. ආරුමුගම් වහාම එතෙන්ට ගියා.

''රික්ෂෝ රාජගිරියට යන්ඩ කීයක් ගන්නව ද?'' කියලා නෝනා ඇහුවා.

''අනේ හාමු මහත්තයා උදේ පාන්දර ඉස් ඉස්සෙල්ලා ඔය කීයක් හරි දෙන්න. තවම දවසට ම වැඩක් හම්බ උනේත් නෑ.'' කියලා ඔහු බොහොම අහිංසක විදියට කීවා.

''එහෙම කියලා බෑනේ. එතෙන්ට ගිහිල්ලා රංඩු කරයි. මම දන්නවනේ රික්ෂෝ කාරයන්ගේ හැටි.''

''චී... චී... හාමු ඔහොම හිතන්ඩ එපා. හැමෝම එහෙම නෑ. මේ කඩවලින් අහන්ඩ ආරුමුගම් ගැන. ඒ මහත්වරු කියයි මං ගැන.... මං මෙතන අවුරුදු පහළොවක විස්සක කාලෙ ඉඳලා ඉන්නේ. නගින්ඩ හාමු නගින්ඩ, හාමුට සාධාරණයි කියන ගාණක් දෙන්න'' යි කියමින් බඩු මලු දෙක අතට ගනිමින් නෝනාව රික්ෂෝවට නගින්නට උදව් කළා. ඈ හිඳගත් පසු පා පුවරුව මත බඩු මළු දෙක ද තබා රික්ෂෝව උසුලාගත් ආරුමුගම් සීනුව නාද කරමින් කොටා පාර දිගේ රාජගිරිය බලා දුවන්නට වුණා.

අද දවස එතරම් නරක විය නොහැකි යැයි දුවන ගමන් ඔහුට සිතුණා. ඉදහිට තමන් පරදා යන කුළී රියක් දකින විට ඔහුගේ හිතට තරහක් ද මතු වුණා. ගමනින් තරමක දුරක් ගිය තැන ලැබුණ පල්ලමද ඔහුට හිතට සතුටක් ගෙන දුනි. ඒ වාසිය ද ලබමින්, පුංචි කෝච්චි රේල් ගේට්ටුව ද පසුකළ ආරුමුගම් රාජගිරියේ ආයුර්වේද රෝහල දෙසට යළිත් දුවන්නට විය. එහෙන් මෙහෙන් යන බස් කාර් ලොරිවල නලා හඬට නිතරම ඔහුට රික්ෂෝව අයින් කරන්නට සිදුවීම ගමනේ වේගයට බාධාවක් වුණා. ඔබේසේකර පුර හන්දියෙන් වමට හැරී මඳක් දුර ගිය තැන නිවසක ගේට්ටුවක් පෙන්වමින් ඒ ළඟ ''නවත්වන්නැ'' යි කාන්තාව පැවසුවාය. මෙතෙක් වේලා කියවමින් ආ ඉංග්‍රීසි පත්තර අකුලා බෑගයේම රුවාගත් ඈ

රික්ෂෝවේම රැඳී සිට කිසිවෙකු හට අඬගෑවාය. වයස අවුරුදු පහළොවක පමණ තරුණියක් ඒ නිවසේ පිටිපස සිට ගෙය අයිනෙන් මතුව දුවවිත් ගේට්ටුව හරිනු ලැබුවාය. ආරුමුගම් නිවසේ පඩිය ළඟටම රික්ෂෝව ගෙනැවිත් නතර කෙළා.

''සෝමා මේවා ගෙට ගෙනියාපං'' යි රික්ෂෝවෙන් බසිමින් ඕ කීවාය. රික්ෂෝකරු සිය වම් අත නළල වෙත ඔසවා දබරැ ගිල්ල නවා ඉන් නළලෙහි නැගුනු දාදිය හූරා දැමීය. අනතුරුව බඩු මළු දෙක රැගෙන නිවසෙ ස්තෝප්පුවේ සිටි මෙහෙකාරිය වෙත දුන්නේය. කරේ දමා සිටි කිලිටි තුවාය ගෙන මුහුණ පිසදා ගනිමින් මිදුල කොනේ ඇති කරාමය දෙස බලා ''හාමු වතුර ටිකක් බොන්නං'' යැයි ඇසුවා. ''හා ඒකට මොකද? ඉන්ඩ ගෙයින් ගෙනත් දෙන්ඩ කියන්නං'' කියත්ම, නැහැ හාමු මේ හොඳ කියමින් ඔහු එතැනට ගොස් කරාමය හැර දෑතම සෝදා දෝතට වතුර ගෙන දෙතුන් විටයක් බීවා. අනතුරුව මුහුණ ද සෝදාගත් ඔහු කරාමය වසා සිනහවෙමින් යළිත් රික්ෂෝව වෙතට ලංවුණා. නිරතුරුව හිරුරැසින් දැවී කළු පැහැ ගැනුණු මුහුණ මත දිය තැවරී යාමෙන් දුහුවිල්ලෙන් තැවරීගත් කළුගල් කැබැල්ලක් දියරෙන් සේදීමෙන් මතුවන පැහැය සෙයින් කම්මුල් දිලිසෙන්නට වුණි. ඒ මත නැගුණු සිනාවෙන් කහට ගැහුණු දත්පෙළ වඩාත් කැපී පෙනෙන්නට විය.

''එහෙනං ගානක් කියන්නේ නෑ.''

''මේ දුරට මොන ගානක්ද හාමු දවසේ ඉස් ඉස්සෙල්ලා කීයක් හරි දෙන්ඩ සන්තෝෂෙන්''

ඇය රුපියල් පහේ කොළයක් ගෙන ඔහු අත තැබුවාය. ඔහු දෑතින්ම එම මුදල ගෙන ගුලිකොට දෑත නමා ඇඟිලි ඇට බිඳ සිනාසී පටියේ පොකැට්ටුවේ දමා ගති. ආ තේ එකකුත් බීලා යනවා කියමින් ඈ තව ශත පනහේ කාසියක් ද ඔහු වෙත දිගු කළාය. ඔහු ''නෑ හාමු මේ හොඳටෝ ඇති'' කියමින් දෑත එක්කොට ආචාර කොට යන්නට සුදානම් විය. ''නෑ, නෑ ගන්ඩ'' කියමින් ඈ ඔහුට කී හෙයින්, රික්ෂෝවේ බෝන් ලීය මත තබා කාන්තාව වෙතට ගොස් එයද පිළිගති. ඇය කොතරම් කරුණාවන්ත තැනැත්තියක්දැයි ආරුමුගම්ට සිතුණි. ''වැදගත් අය ඔහොම තමායි'' ඔහුට ම කියා ගත්තේය. හෙතෙම අනතුරුව වත්තෙන් පිටව විත් රික්ෂෝව නවතා ගේට්ටුව වසා යළිත් බොරැල්ල දෙසට ඇදී ගියේය.

සිරිත් පරිදි ආරුමුගම්ගේ දිවිය මෙසේ ගෙවී ගියේය. දිනෙන් දින සිය රැකියාව පවත්වාගෙන යාම සඳහා අළුත් ගැටලු නැගී ආ මුත් ඔහු එයින් කම්පිත නොවීය. ලද දෙයකින් සිය දිවිය වත්තං කරගන්නට ආරුමුගම්ගේ ඇත්තෝ හුරුපුරුදු වී සිටියහ.

දිනක් නෝනෙකු හා මහත්තයකු තමන් සිටි තැනට එන බැව් ආරුමුගම් දුර සිට දුටුවේය. ඔහු මොහොතක් කල්පනා කළේය. ක්ෂණයකින් මේ එදා රාජගිරියට ගිය නෝනා නොවේ දැයි ඔහුට සිතුණි. ඔහු වහා රික්ෂෝවේ පා පුවරුවෙන් නැගී ඔවුන් ඉදිරියට ගියේය.

''රික්ෂෝ කොහොම ද? අඳුරන්නට පුළුවන් ද?'' යි ඇය සිනාසෙමින් ඇසුවාය.

''ඇයි බැරි හාමු? මට හොඳට මතකයි. අර.... රාජගිරියේ....''

''ඔව්.... ඔව්.... එහෙනම් හොඳ මතකයක් තියෙනවා නේ ද?''

''ඔව් හාමු හාමුලා වගේ කරුණාවන්ත අය අපට අමතක වෙන්නේ නෑ.''

''ඒක නෙමෙයි රික්ෂෝ තවම අපි රික්ෂෝගෙ නම දන්නේ නෑ නොවැ.''

''ආරුමුගම්'' මං හැමදාම ඉන්නෙ මෙතන කුළියක් ගන්ඩ. ඇයි හාමු මේ හදිසියෙන්''

''අපි ආවේ ආරුමුගම්ට අපට උපකාරයක් කරන්ඩ පුළුවන්ද කියලා අහන්ඩ. මේ මගේ මත්තයා''

ආරුමුගම් එම කාන්තාවගේ සැමියා දෙස බලා දෑත එක්කොට ආචාර කළේය. හේ ද දෑත ඔසවා ඔහුට ප්‍රති ආචාර කළේය.

''මොකක්ද හාමු මගෙන් කෙරෙන්ඩ තියෙන්නේ?''

''ආරුමුගම්ට පුළුවන්ද අද හවසට ඒ වැඩය ගැන කථාකර ගන්ට අපේ ගෙවල් පැත්තෙ එන්ඩ?'' ''බස් එකේ එන්ඩ'' ඕ කීවාය.

''අමතක නම් වික්ටර් මොරගොඩ පෙරකදොරු මහත්තයාලාගේ ගෙදර කොහෙද කියලා අහන්ඩ.''

''හොඳමයි හාමු.''

එදින හවස ආරුමුගම් මොරගොඩ මහතාගේ නිවසට ගියේය. ඒ යන විට මොරගොඩ මහතාත්, හාමුත් පස්වසරක් පමණ වයස වූ දැරියක් ද නිවසේ සාලයේ සැප පුටුවල අසුන්ගෙන සිටියහ. ආ.... ආරුමුගම්නේ මේ. එන්ඩ එන්ඩ කියමින් ගෙහිමි දුව ඔහු කැඳවූවා ය. ඉන්ඩ මම පුටුවක් ගේන්නම් කියමින් ඈ ගෙතුලට යන්නට සූදානම් වූ විට එපා එපා හාමු කියමින් ආරුමුගම් ඇය වලක්වමින් ඉස්තෝප්පු පඩියේ වාඩිවෙන්නට සූදානම් විය. හා හා එපා, ඉන්ඩ මං පුටුවක් ගෙනෙන්නම් යයි කියමින්, මොරගොඩ මහතා එය වැළැක්වීමට උත්සාහ ගත්තද, ඔහු ඒ වන විට පඩිපෙළෙහි ඉහළම පඩියෙහි වාඩි විය.

''ඉතින් හාමු, මොකක්ද මට.... එන්ඩ කියාපු උවමනාව?''

මේ අපේ පුංචි බේබි කොලේජ් එකට ගෙනියන්න පුළුවන් ද අහන්ඩ?''

''ෂා, කොච්චර එකක්ද, හාමුලා වගේ උදවියට අපිට එහෙම හරි උදව්වක් කරන්න ලැබෙනවනම්, කොච්චර හොඳද''යි කීවේ මහත් සන්තෝෂයකින් මුහුණ පුරවා ගනිමිනි. ඔහුගේ මුහුණ කරුණාවෙන් ද, අහිංසක කමින් ද පිරී ගියේය. ඔහු සිනහවකින් මුව සරසා ගනිමින් පොඩි දරුවා දෙස ද බැලුවේය.

තාප්පය අයිනේ ඇති මල් පාත්තිවල බාබන්ඩේසි, රෝස හා කානේෂන් මල් ගස් සරුවට වැවී ඇත. ඒවායේ අතරින් පතර පිපී ඇති මල් වලින් ගෙවත්තට අමුතුම සිරියාවක් එක්කරනු ලැබීය. මිදුල පුරා වැවීගත් තණකොළ මැනවින් කපා සකස් කරනු ලැබීමෙන් පලසක් ඇතුරූ සෙයක් දිස්විණි.

''පුතාට පුළුවන් ද මේ ආරුමුගම්ගේ රික්ෂෝවෙන් කොලේජ් යන්නැ''යි දරුවාගේ හිස අතගාමින් කාන්තාව විමසුවා ය.

දරුවා ඇගේ ඇඳුමෙහි එල්ලී ගෙනම ඈ වෙත බලා හිස සැලුවා ය.

''කොහාට ද හාමු යන්න ඕනෑ?''

''මියුසියස් එකට''

''දන්නවාද තියෙන තැන. අර මැතිනිගේ බංගලාව ළඟ''

''ආ, ඔව් හාමු, ඔය රෝස්මීඩ් එකේ තියෙන කොලිජිය නේද? මම දන්නවා ඒක'' කියමින් හේ සිය කරේ රුවාගෙන සිටි දුඹුරු පැහැ ගැණුනු තුවාය ගෙන මුහුණට කිහිප විටක් පවන් සලා ගත්තේය.

''ආරුමුගම්ට අපි මේ වගකීම පැවරුවේ හොයලා බලලා. හාමු මහත්තයට දුව එක්කන් එන්න යන්න වෙලාවක් නැහැ, උසාවියේ වැඩ නිසා, ඉතින් අපි බොරැල්ලේ ඉන්ස්පෙක්ටර් මහත්තයටත් කිව්වා කෙනෙක් ගැන. පස්සෙ අපිට කඩේ මුදලාලි කිව්වා, ආරුමුගම් අවංක, හොඳ කෙනෙක් ය කියලා.''

ආරුමුගම්ගේ කළු පැහැගත් මුහුණ මත දීප්තියක් මතුවිණි. ඒ හාම කහට ගැහුණු දත් දෙපළ විදා හිනාවක් මුවගට නගා ගනිමින් තමන් තුළ උපන් ආත්මාඩම්බරයකින් යුතුව ''ඔව් හාමු, මම මෙච්චර කාලයකට හොරකම් කරලා නෑ, වංචා කරලා නෑ. මම බේබි  හාමු ආරස්සා කොරාන කොලිජී ගෙන යන්නම්''යි කීවේය.

''මේ වැඩේට ආරුමුගම්ට අපි රුපියල් සීයක් දෙනවා මාසෙකට. හරියට උදේ හතට එන්ඩ. හරියට දවල් දොළහට කොලිජියට යන්ඩ. අනික් වෙලාවට වෙනත් වැඩක් කරගන්ඩ. බැරි දවසක් තිබ්බොත් කල් ඇතුව කියන්න. හොඳද?

''හොඳමයි හාමු, කවද ඉදන්ද එන්ඩ ඕනෑ.''

''ජනවාරි පස් වැනි දා ඉඳලා''යි කියමින් ඈ ගෙන ගියා ය.

මොහොතකින් මෙහෙකාරිය කේක් කැබැල්ලක් ද, තේ කෝප්පයක් ද ගෙනැවිත් ආරුමුගම් ට දුන්නාය. ආරුමුගම් එය ඉතා සතුටින් පිළිගත්තේ ය. තේ බීමෙන් පසු ආරුමුගම් පිටත්ව යාමට සැරසෙන විට මොරගොඩ මහතා රුපියල් විසිපහක් ආරුමුගම් අත තබමින්, වැඩේ ඕනෑකමින් පරිස්සමින් කරන්ඩ. අපි තව සලකවායි කීවේය. ඔහු එය දෑත දිගුකොට කෘතඥතා පූර්වක බැල්මකින් යුතුව පිළිගත්තේය. අනතුරුව හේ මොරගොඩ බංගලාවෙන් නික්මුණි.

ජනවාරි පස් වැනි දා අලුයමින් පිබිදුණු ආරුමුගම් ගෙයින් එළියට විත් සිය තුවාය ගෙන රික්ෂෝවේ ආසනය මැනවින් පිස දැම්මේය. මුහුණ කට සෝදාගෙන බිරිඳ පිළියෙළ කරදුන් තේ ටික එක උගුරට දෙකට ගිල දැමීය. රෝද දෙකේ බෝස් ගෙඩි වලට දැව් තෙල් දැමීය. දුණුකොළ මිටියට ද තෙල් තැවරීය. ඊයේ සෝදා වේලාගත් අත්කොට මේස් බැනියමත්, කාකි කොට කලිසමත් හැඳ ගත්තේය. පරණ කැන්වස් සපත්තු දෙක පොළවේ තට්ටු කොට දූවිලි හැරදා දෙපයේ ලා ගත්තේය. හේ නැගී එන හිරු දෙස බලා වැන්දේය. අනතුරුව රික්ෂෝව වටා පැදකුණු කොට බෝන් ලීය අතරට බැස රික්ෂෝව ගෙව රාජගිරිය බලා පිටත්ව ගියේය.

උදේ හයහමාර වන විට ආරුමුගම් මොරගොඩ නිවසට පැමිණ ගේට්ටුවට තට්ටු කෙළේය. මෙහෙකාරිය විසින් ගේට්ටුව හරිනු ලැබුවාය. ඔහු රික්ෂෝව ගේ ඉදිරිපස නැවැත්වීය. මොරගොඩ මහතා ගෙලෙහි ටයි පටිය බැඳ ගනිමින්, නිවසින් එළියට පැමිණ, ''ආ, ආරුමුගම්, උදේ ආවා, හරි හොඳයි. දරුවා ව පරිස්සමින් ගෙනියන්න'' යයි කීවේය.

''හොඳමයි හාමු'' යයි ආරුමුගම් පිළිතුරු දුනි.

පලසක් සේ ඇතිරිගත් අග ලා තණපත් මත විසිරිගිය පිණිකැට හිරු රැස් වැටී මුතුකැට සෙයින් දිලිහී ගෙන ඇත.

මිදුලේ පිපීගත් රෝස, බාබන්ඩේසි හා කානේෂන් මල්වල සුවඳ මුළු පරිසරය නැවුම් කර ඇත්තේය.

කිරි සුදු ගවුමකින් සැරසී සුදු සපත්තු දෙකක් ද පැළඳී, අලුත්ම පොත් බෑගයක් කරෙහි රුවාගත් දරුවා සමඟින් හාමු එළියට ආවාය. ඈ අලංකාර සාරියකින් හා හැට්ටයකින් සැරසී සිටියා ය. මෙහෙකාරිය කිරි තේ වීදුරුවක් ගෙනැවිත් ආරුමුගම් ට දුන්නා ය. ඔහු එය දෑතින් ගෙන බී, උද්‍යානයේ කරාමයෙන් හිස් වීදුරුව සෝදා මෙහෙකාරිය අත තැබුවේය.

''කන්දසාමි ගේ පිහිටයි, වාඩිවෙන්න'යි කියමින් ආරුමුගම් දරුවා ඔසවා රික්ෂෝවේ වාඩිකරවමින් ලොකු හාමුත් වාඩිවෙන්නයි කීවේය. ඇය ද වාඩි වූ පසු ඔහු මොරගොඩ මහතාට ආචාර කොට නිවසින් පිටත්වුණි. ආරුමුගම්ට අදින් පැවරෙන වගකීම කොතෙක් බාර ධූරදැයි ඔහු යන ගමන් සිතුවේය. එසේම කුඩා දරුවකු රැගෙන පාසලට යාමට ලැබීම ඔහුගේ සිතට මහත් සැනසුමක් ගෙන දෙන කරුණක් ලෙසින් දැනුණි. මෙලෙස දින කීපයක් දරුවා සමඟ පාසලට ගිය ලොකු හාමු දරුවා පාසලට හුරුකිරීමෙන් පසු නැවතුනාය.

කල්යත්ම මොරගොඩ පවුලේ හිතවතෙකු මෙන්ම, විශ්වාස කටයුතු සේවකයෙකු වූ ආරුමුගම්, බේබි හාමු කෙරෙහි දැක්වූයේ මහත් සෙනෙහසකි. මහවැහි දිනක පවා රික්ෂෝවේ ඉදිරියේ ඇති ආවරණය පහතට හෙළා, ගෝනියෙන් නවා තනා ගත් වැහි කබාය තම හිසෙහි ලා ගෙන කෙසේ හෝ අප්‍රමාදව නිවසට එන්නේය. මෙවන් දිනයක ලොකු හාමු ''ඇයි ආරුමුගම්, වැස්ස පායනකං ඉඳලා නාවේ. තෙමුණා නේද'යි අසයි. ''නෑ හාමු, බේබි හාමුට බඩගිනි ඇතිනේ, ඒකයි ආවේ'යි කියයි. දැන් දැන් ආරුමුගම් නිවසට පැමිණෙන විට කෑම ද ලැබෙයි. ඔහු ගෙදරට කළමනා දෑ ගෙනවිත් දෙන්නේ ද, රික්ෂෝවෙනි. බේබි හාමු ද ආරුමුගම් කෙරෙහි දැක්වූයේ ඉමහත් ආදරයකි. ඇගේ උපන් දිනය දාට ආරුමුගම්ට ද අත්කොට බැනියමක් හා සරමක් ද ලැබෙයි. ඔහු එය පිළිගත්තේ දෙවියන්ගේ රැකවරණ බේබි හාමුට ලබා දෙන ලෙස අයැදිමිනි. කාලය මෙලෙසින් ගෙවීයත්ම, බේබි හාමු ද වැඩී ආවේය. පසු කලෙක රික්ෂෝවෙන් පාසල් යාමට ඈ අදිමදි කළාය. එහෙයින්, ඊළඟ වාරයේ සිට දරුවා කාරයකින් ඇරලීමට මාපියෝ විධිවිධාන සැලසූහ. මේ බව දැනගැනීමට ලැබීමෙන් ආරුමුගම් මහත් සේ කැළඹීමකට පත් වුණි. ඒ ඔහුගේ ආදායම් මාර්ගය වැසීයාම නිසා සිදුවීමක් නොවීය. ඔහු එතරම්ම බේබි හාමුට ඇලුම් කළේය. මොරගොඩ පවුලට හිතවත් ද විය. එම වාරයේ අවසාන දිනයේ බේබි හාමු කැඳවා ගෙන නිවසට ආ ඔහු නිවස ඉදිරිපිට රික්ෂෝව නැවැත්තුවේ ය. ඔහුගේ දෑස කඳුලින් පිරී තිබුණි. බේබි හාමු ඔහු දෙස බැලුවාය. ඇයට ද මහත් සේ දුකක් ඇති විය. ආරුමුගම්ගේ දෙනෙතෙහි පිරීගත් කඳුලු කම්මුල් දිගේ බේරෙන්නට විය.

''ආ ආරුමුගම් අඬනවා නේද'යි දරුවා විමසත්ම ''නෑ, බේබි හාමු, නෑ'' යි කියමින් ඔහු කිලිටි තුවාය ගෙන මුහුණ වසා ගෙන හඬන්නට විය. එවිටම ලොකු හාමු නිවස ඉදිරියට ආවාය. මිදුලේ සිටගෙන නැවතී සිටින ආරුමුගම් දැක ආරුමුගම්, ඇයි අඬන්නේ'' යයි ඇසුවාය.

‘‘ලොකු හාමු, බේබි හාමුත් එක්ක කොලිජ් ගිය අන්තිම දවස අද, මට හිතට හරියට දුකයි. මගෙන් වරදක් වුනේ නැහැ, මට හාමුලා අමතක කරන්න බැහැ, මැරෙනකං මං, මැරෙනකං’යි කියමින් ඉකි බිඳින්නට විය.

‘‘නෑ ආරුමුගම්, ආරුමුගම් ගෙන් වරදක් වුණාට නෙවෙයි, බේබි දැන් ලොකුයි නේ. ඉතින් කොලිජියේ අනික් බේබිලා මෙයාට හිනාවෙනවලු රික්ෂෝවේ එනවට. ඒක හින්දයි. ඕක ගණන් ගන්න එපා. අපි වෙනත් තැනක පොඩි බේබි කෙනෙක් ඇරං යන්න හොයලා දෙන්නම්කො. ආරුමුගම්ට විවේක වෙලාවට මෙහෙ එන්න, වැඩක් පලක් කරලා දීලා යන්න.’’ යි කියමින් ගෙට ගිය ඈ පාර්සලයක් ගෙනැවිත් බේබිහාමු ලවා ආරුමුගම්ට දේවිය. එය මහත් සෙනෙහසින් පිළිගත් ඔහු, ඔවුන්ට ආචාර කොට පිටවී ගියේ ය.

ඊළඟ වාරයේ සිට බේබි හාමු පාසලට ගෙන ඒමටත්, ආපසු රැගෙන යාමටත්, මොරගොඩ මහතා මිළදී ගත් රථයෙන්ම කටයුතු සැළසුණි. ඒ සඳහා රියැදුරෙක් ද සේවයට ගැනුණි. ඒ වාරයේ පළවෙනි දිනය දා, සිරිත් පරිදි ආරුමුගම් රික්ෂෝව රැගෙන ගොස් පාසල ඇරෙනතුරු වෙනදා සිටි තැනට වී බලා සිටියේ ය. ඒ හාම ආරුමුගම් යයි හඬක් නැගුණි. කාරයට නැගගත් දැරිය එහි ජනේලයෙන් එබෙමින් ආරුමුගම්ට අත වැනුවා ය. ඔහුගේ මුහුණේ ශෝකය යටපත් කොට හිනාවෙන් පිරී ගියේය. ක්ෂණයකින් කාරය හඬනගා ඔහු සිටි තැනින් හරවා රෝස්මිඩ් පෙදෙස දිගේ ඉදිරියට ඇදෙන්නට විය. ආරුමුගම් ද සිය රික්ෂෝව ගෙන එය පසුපස හැගීමකින් තොරව දුවන්නට වූයේ. දරුවා ආපසු හැරී රික්ෂෝව දෙස බලමින් අත වැනීය. ඔහු ද විටින් විට අත වනන්නට විය. වැඩි කාලයක් ගත වන්නටත් මත්තෙන්, කාරය වේගයෙන් ඇදී වංගුවෙන් දකුණට හරවා නො පෙනී ගියේ ය.

ආරුමුගම් වේගය බාල කොට රික්ෂෝව ඉඩ ඇති තැනක තුරු සෙවනක නවතා එහි පාපුවරුවේ වාඩිවී කිලිටි තුවායෙන් මුහුණ වසාගෙන හඬන්නට විය.




# PRAYER TO SURRENDER
## பூரண சரணாகதி

பூரண சரணாகதி என்பது எவ்விதமான பிரதிபலனையும் கருதாமல் தங்கள் உடல் அளவிலும், மனதளவிலும் முழுவதுமாக தாம் வணங்கும் இஷ்ட தெய்வத்திடமோ அல்லது பரம்பொருளிடமோ தமது வேண்டுதல்களையோ, விருப்பங்களையோ முன்வைத்து எல்லாவற்றையும் ஒப்புவிக்கும் ஒருவகையான அதிஉயர் பக்தியாகும்.

வாழ்வில் மானிடர்கள் எத்தனையோ சவால்களுக்கு முகம் கொடுக்க வேண்டியுள்ளது. மனிதனால் செய்யக்கூடிய செயல்களை, சிறப்பாகச் செய்வதற்கும் அச்செயல் நடைமுறைப்படுத்தப்பட்டு எதிர்பார்த்த பயன்களைப் பெறுவதற்கும் தெய்வ அனுகூலம் தேவைப்படுகின்றது. எம்மை அறியாமலே எம்மை ஒரு சக்தி இயக்குகின்றது என்பது என்றோ யாவரும் அறிந்த அநுபவித்த ஒரு உண்மையாகும். ஆம் அச்சக்தியை உணர்ந்த மக்கள் தங்கள் தங்கள் இன, மத, குல அடிப்படையில் புத்தர், அல்லா, இயேசு, சிவன், அம்பிகை, முருகன், விஷ்ணு, லக்ஷ்மி, பகவான் பாபா எனப் பலவகை தோற்றங்களில் இனக்கண்டு வெவ்வேறு பெயர்களில் தெய்வங்களாக வழிபடுகின்றனர் என்பது அனைவரும் அறிந்ததே. எனவே எம் சக்திக்கு அப்பாற்பட்ட செயல்களை எமது பிரார்த்தனையின் நிமித்தம் அவரவர்கள் வழிபடும் தெய்வங்களே நிறைவேற்றி வைக்கின்றனர் என்பது உண்மையின் உண்மையாகும்.

எனவே நாம் எம்மால் தீர்க்க முடியாத பிரச்சினைகள் பல வரும்போது அதனை இறைவனின் பாதக்கமலங்களில் ஒப்படைத்து, அவர் தரும் சிறந்த பலனை எதிர்பார்த்து சாதிக்கின்றோம். காலதாமதமானாலும் **“ கடவுள் செயல் கச்சிதமாகவே”** அமையும் என்பது பூரண சரணாகதியை முன்வைத்தோர் அநுபவித்த ஆனந்தம் தரக்கூடியது.

அது மட்டுமல்ல இறைவனை பூரண சரணாகதியடையும் போது இறைவன் எமது பிரார்த்தனையை ஏற்று அச்செயலை வெற்றிகரமாக செய்து முடிப்பதற்கான அணுகுமுறைகளை எமக்குணர்த்தி எம் மூலமே அச்செயலை நன்கு திறம்பட செயலுருவம் பெறச் செய்கின்றார் என்பது அநுபவபூர்வமான உண்மையாகும்.

சரணகதியான பக்தியை கடைப்பிடிக்கும் போது சிறிதளவேனும் சந்தேகம் எழக் கூடாது. இது நடக்குமா நடக்காதா? என்ற கேள்விகள் மனதில் எழுதலாகாது மாறாக **“ நல்லதே நடக்கும்”** என்ற உறுதியான எண்ணம் உள்ளத்தில் வேரூன்ற வேண்டும் அப்போது வெற்றி நமதே ஜெயம் ஜெயமே.

திருமதி லீலாவதி மோகனசுந்தரம்
உதவிச் செயலாளர்
Hon.Assistant Seceretry
Leela moganasundaram
0778378506



# Congratulations !

**Central Bank of Sri Lanka Pensioners Association**

**50 Golden Years**

(1975-2025)

May you grow from strength to strength
with Best Wishes

**Berney Fernando**
(P/331)



# With Best Complements

**Central Bank of Sri Lanka Pensioners Association**

**Golden Jubilee**

From

**Ms. Chandrakanthi Edirimanne**

# දෙබිඩි මිනිසුන්

‘‘මිනිසුන් වර්ග දෙකක් සිටින බව මගේ පියා මට පවසා ඇත. ඉන් එක් කොටසක් වැඩ කරන අයයි. අනෙක් කොටස ලකුණු දමා ගන්නා අයයි. මගේ පියා මට නිතර උපදෙස් දී ඇත්තේ මින් පළමු කොටසට වී සිටින ලෙසයි. එයට හේතුව වැඩ කරන මිනිසුන් අතරේ තරඟයක් නැති බැවිනි. තරඟය ඇත්තේ වැඩ නොකර ලකුණු දමා ගන්නා මිනිසුන් අතරේ බැවිනි.’

**මහත්මා ගාන්ධි**
රුවන්වැකි
උපුටාගැනීමකි.

මෙහි ඇතුළත් සියළුම ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම අදාළ ලේඛකයන් සතු බව සැලකුව මනාය.

**සංස්කාරක**






1975 සැප්තැම්බර් 1 දින අපි දෙදෙනා
මහ බැංකු සේවයට ඇතුළත් වුනෙමු.
අපගේ මහ බැංකු දිවියෙත්
ස්වර්ණ ජයන්තිය සමරන
මෙම අවස්ථාවේදීම
අප විශ්‍රාමික සංගමයේ ද
ස්වර්ණ ජයන්තිය සැමරීම
සතුටට කරුණකි.
අපගේ බැංකු දිවිය සව්මත් කිරීමට
අත හිත දුන් දිවංගත සියළුම
ජ්‍යෙෂ්ඨ නිලධාරී මහත්වරුන්ටත්
අප දෙදෙනාගේ ප්‍රණාමය පළකරමු.
සුජීවත්ව සිටින සියළුම විශ්‍රාමික
ඔබ සැමට නිරෝගී සුවය පතන්නෙමු.

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
දිගුකල් දිනේවා !

ඥාණා රණතුංග
පද්මිණි විජේරත්න



පළමු අධිපති - ජෝන් එක්ස්ටර්
1950 - 1953



එන්.යූ. ජයවර්ධන
1953 - 1954



ශ්‍රීමත් ආතර් රණසිංහ
1954 - 1959



ඩී.ඩබ්. රාජපතිරණ
1959 - 1967



ඩබ්. තෙන්නකෝන්
1967 - 1971



එච්.ඊ. තෙන්නකෝන්
1971 - 1979



ආචාර්ය ඩබ්. රාසපුත්‍ර
1979 - 1988



ආචාර්ය
එච්.එන්.එස්. කරුණාතිලක
1988 - 1992



එච්.බී. දිසානායක
1992 - 1995



ඒ.එස්. ජයවර්ධන
1995 - 2004

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික සංගමයේ සභාපතිවරුන් වන
එල්.ඩබ්.ඒ. වීරසේකර (ආරම්භක සභාපති-1975), ඒ.සී.පී. ගුණසේකර,
එම්.එස්. ජලල්ඩීන්, ඒ.ඒ.ඩී.ඊ. අබේවීර, එම්.බී.ඩී. සිල්වා, ලෙස්ලි රණසිංහ

**දැයට විශිෂ්ඨ සේවාවක් ඉටුකොට ඔවුන් ජීවන දහමට අනුව**
**කීර්තිනාමය පමණක් ශේෂ කොට දිවංගත වූහ.**

දිවංගත සියළුම මහ බැංකු අධිපතිවරුන්ට හා 1975 වසරේ මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය පිහිටුවාලීමේ පුරෝගාමී මෙහෙවරක් කොට මතකය පමණක් ඉදිරි කොට අපෙන් සමුගත් සහෘදයන් සැම දෙනාට සසර බව ගමන කෙළවර සුගතිගාමී ජීවිතයක්ම අත්වේවා.



ඩබ්. රණසිංහ
2003-2006



ඔස්ටින් මිහිඳුකුලසූරිය
2009-2012



එම්.යූ.ඒ. තෙන්නකෝන්
2012-2013



ලක්ෂ්මන් ද සිල්වා
2013-2016



ආරියදාස තන්ත්‍රීගේ
2019-2020
2023-2024



ජයලාල් ජයවර්ධන
2016-2019
2020-2023
2024-2025

අප සංගමයේ සුජීවත්ව සිටින සියළුම සභාපතිවරුන්ට හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට චිර ජීවනය හා සෞභාග්‍ය ප්‍රාර්ථනා කරමි.

**සුපැතුම් !**
**ඔස්ට්‍රේලියාවේ පර්ත් නුවර සිට**
**එල්.එල්. ඩග්ලස් සිල්වා (විශ්‍රාමික)**
(1963-2005)